# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,876 — 1969 ඔක්තෝබර් 17 වැනි සිකුරාද — 1969.10.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1733 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1742 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1737 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1739 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පතයෙහි VI වැනි කොටස ක්‍රිස්තියානි විවාහ ලියාපදිංචි කිරීම සඳහා ලේඛන ගත කර ඇති සියළුම ගොඩනැගිලි ලැයිස්තුවක් පළවේ.

## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා ප්‍රකාශවන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම මුල්වරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

**සංලක්ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තාවූ ද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ දුතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු** (i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එතෙකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුව හොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත්ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැණුම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

## ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

### ඇබෑර්තුවක්

යාන්ත්‍රික ඉංජිනේරු තනතුර සඳහා 1969 නොවැම්බර් 30 දින තෙක් ලාංකිකයින්ගෙන් අයදුම් පත් භාරගනු ලැබේ.

**සුදුසුකම්.**—පූර්ණ වෘත්තීය සුදුසුකම් සහ අනතුරුව පස් ඇදීමේ බර යන්ත්‍ර ක්‍රියා කරවීම හා වැඩපොළ පාලනය පිළිබඳව විශේෂ දැනීමක්ද සමග දස වසරක පළපුරුද්දක්.

**වයස.**—1969. 10. 1 දිනට 50 වසරකට අඩු.

**කොන්දේසි.**—වැඩකල යුතුව ඇත්තේ වලවේ නිම්නයේ වන අතර, එහිම පදිංචි විය යුතුය. අම්පාරේ ප්‍රධාන වැඩපොළ පරිපාලනය කිරීමද ඔහුට භාරවේ. මසකට රු. 2000 සිට රු. 2500 දක්වා සියළු දීමනා අඩංගු වැටුපක් මත 5 වසරක කොන්ත්‍රාත්තුවක් පිරිනැමිය හැක. අදාල පුද්ගලයන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව මෙම වැටුප් පරිමාණයේ ලක්ෂ්‍යයක තැබීම සලකා බැලිය හැක.

වෙනත් තොරතුරු හා අයදුම් පත් පහත අත්සන් කළ අයගෙන් ලබාගත හැක.

අයදුම් පත් පහත අත්සන් කළ අය වෙත ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලියුම් කවරයේ වම්පස ඉහත කොනේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

ආර්. වී. ජයසූරිය,
ප්‍රධාන ලේකම්.
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7,
1969 ඔක්තෝබර් 5 දා.

10-709

## නැගෙනහිර කඩදාසි කම්මාන්ත සංයුක්ත මණ්ඩලය

### II ශ්‍රේණියේ තත්ව පාලක සහකාර තනතුරු

**සුදුසුකම් සහ පළපුරුද්ද.**—රසායන විද්‍යාව හා තෘණ විද්‍යාව/ජීව විද්‍යාව හා ගණිතය සහිතව උසස් අධ්‍යාපන සහතිකය හෝ අධ්‍යයන පොදු සහතිකය (උසස් පෙළ) හා රසායනාගාරයක 2 වසරක පළපුරුද්ද හෝ රසායන විද්‍යාවට හා තෘණ විද්‍යාවට/ජීව විද්‍යාවට හා ගණිතයට සම්මාන සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හා යටත් පිරිසෙයින් රසායනාගාරයක 5 අවුරුදු පළපුරුද්ද.

**වයස.**—අවුරුදු 30 ට අඩු.

**වැටුප් පරිමාණය.**—රු. $\frac{360—450}{6\times15}$ මාසික (සියලු දීමනා අඩංගු)

රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රජයේ දෙපාර්තමේන්තු හා රජයේ සංස්ථාවන්හි අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්, ඒ ඒ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වන අතර, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා විධි විධාන පනත ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පනවා ඇති හෝ මතු පනවන ලබන නියෝගයන් අනුව කටයුතු කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් වාලච්චෙනෙයි හෝ දිවයිනේ පිහිටි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කළ යුතු වනු ඇත.

පත් කිරීම සඳහා තෝරා ගනු ලබන්නන් ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් පරිමාණයෙහි සුදුසු පියවරක තබනු ඇත.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල අයදුම්කරුවන්ගේ අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් පත් 69.11.7 දිනට හෝ ඊට පෙර සාමාන්‍යාධිකාරී වෙතට ලැබෙන සේ පහත ඇති ලිපිනයට එවිය යුතුය.

අයදුම් පත් තැපැලෙන් ඉල්ලුම් කරන විට තමන්ගේ ලිපිනය සහිත මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතුය.

මේ සඳහා ඉල්ලුම් කළ යුත්තේ අවශ්‍ය සුදුසුකම් ඇති අය පමණකි.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කම්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1367,
356, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1969 ඔක්තෝබර් 1 දින.

10–715/1—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කම්මාන්ත සංයුක්ත මණ්ඩලය

### III ශ්‍රේණියේ තත්ව පාලක සහකාර තනතුරු

**සුදුසුකම් සහ පළපුරුද්ද.**—රසායන විද්‍යාව හා තෘණ විද්‍යාව/ජීව විද්‍යාව හා ගණිතය සහිතව උසස් අධ්‍යාපන සහතිකය හෝ අධ්‍යයන පොදු සහතිකය (උසස් පෙළ) හා රසායනාගාරයක 1 ක් වසරක පළපුරුද්ද හෝ රසායන විද්‍යාවට හා තෘණ විද්‍යාවට/ජීව විද්‍යාවට හා ගණිතයට සම්මාන සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හා යටත් පිරිසෙයින් රසායනාගාරයක 3 වසරක පළපුරුද්ද.

**වයස.**—අවුරුදු 30 ට අඩු.

**වැටුප් පරිමාණය**—රු. $\frac{285—375}{6\times15}$ මාසික (සියලු දීමනා අඩංගු)

රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රජයේ දෙපාර්තමේන්තු හා රජයේ සංස්ථාවන්හි අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්, ඒ ඒ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වන අතර, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා විධි විධාන පනත ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පනවා ඇති හෝ මතු පනවන ලබන නියෝගයන් අනුව කටයුතු කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් වාලච්චෙනෙයි හෝ දිවයිනේ පිහිටි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කළ යුතු වනු ඇත.

පත් කිරීම සඳහා තෝරා ගනු ලබන්නන් ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් පරිමාණයෙහි සුදුසු පියවරක තබනු ඇත.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල අයදුම්කරුවන්ගේ අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් 69. 11.7 දිනට හෝ ඊට පෙර සාමාන්‍යාධිකාරී වෙතට ලැබෙන සේ පහත ඇති ලිපිනයට එවිය යුතුය.

අයදුම් පත් තැපැලෙන් ඉල්ලුම් කරන විට තමන්ගේ ලිපිනය සහිත මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතුය.

මේ සඳහා ඉල්ලුම් කළ යුත්තේ අවශ්‍ය සුදුසුකම් ඇති අය පමණකි.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කම්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1367,
356, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1969 ඔක්තෝබර් 1 දින.

10–715/2—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## වවුනියා දිස්ත්‍රික්කයේ නඩුවෙඩ්ඩිකුලම් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ වවුනියා දකුණු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය

නඩුවෙඩ්ඩිකුලම් උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ, හෝ එහි කාලයක් පදිංචි වී සිටීම හේතුකොටගෙන ගම්වාසීන්ගේ සැලකුම් ලබන, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නො අඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, පලාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාල වල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම් වල ද ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර වල සකස් විය යුතු අතර, ඒවා 1969 දෙසැම්බර් මස (7) හත් වෙනි දිනට හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය.

බී. සී. පෙරේරා,
දිස්ත්‍රික් රෙජිස්ත්‍රාර්.

1969 ඔක්තෝබර් මස අට වෙනි දින,
වවුනියා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

10–798—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

මගේ අංකය : ආර්ඕජ්/296,

### ලංකාණ්ඩුවේ විභාග දෙපාර්තමේන්තුව

**රජයේ සංගීත විද්‍යාලයයේ සහ රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයයේ විභාග ප්‍රතිඵල—1969**

පහත නම් සඳහන් අයදුම්කරුවෝ රජයේ සංගීත විද්‍යාලයයේ අවසාන පරීක්ෂණයෙන් සමත්ය හ.

**1 වැනි පංතිය (ගායනය)**

කිසිවෙකු නැත.

**1 වැනි පංතිය (වාදනය)**

| | නම | විභාග අංකය | භාණ්ඩය |
|---|---|---|---|
| 1. | පෝල් රේමන්, ඩබ්ලිව්. ඩී. ... | 54 | ... තබ්ලාව |

**2 වැනි පංතිය (ගායනය)**

| | නම | විභාග අංකය |
|---|---|---|
| 1. | ජයවීර, අයි. එස්. ... | 40 |
| 2. | සමුද්‍රවතී, ආර්. පී. ... | 50 |
| 3. | ලෙස්ලි රපියෙල්, පී.එල්. | 55 |
| 4. | සුමනදාස, ඩබ්ලිව්. ඒ. ... | 56 |
| 5. | ජයසිංහ, ජේ. ඩී. කේ. ... | 60 |
| 6. | මැණිකේ, එස්. ... | 67 |
| 7. | අමරසිංහ, බී. කේ. ... | 70 |
| 8. | පීරිස්, එස්. ඒ. ... | 72 |

| | නම | | විභාග අංකය | | භාණ්ඩය |
|---|---|---|---|---|---|
| **2 වැනි සංකිය (වාදනය)** | | | | | |
| 1. | ඒකනායක, ඊ. එම්. වයි. | ... | 51 | ... | තබ්ලාව |
| 2. | මැණිකේ, එස්. | ... | 67 | ... | වයලීනය |
| 3. | ගුණසේන, කේ. පී. | ... | 71 | ... | වයලීනය |
| 4. | වික්‍රමනායක, ඒ. | ... | 77 | ... | සිතාරය |
| 5. | බණ්ඩාර, ටී. එම්. සී. | ... | 80 | ... | සිතාරය |
| 6. | බණ්ඩා, එච්. එම්. ටී. | ... | 85 | ... | එස්රාජය |
| 7. | ඇනස්ටින්, එච්. ඩී. | ... | 87 | ... | බටනලාව |
| 8. | අනුලාවතී, බී. එච්. | ... | 89 | ... | වයලීනය |
| 9. | සෝමලතා, එන්. එල්. | ... | 94 | ... | වයලීනය |
| **3 වැනි පංතිය (ගායනය)** | | | | | |
| 1. | චන්ද්‍රසිලින්, ටී. ඒ. | ... | 48 | | |
| 2. | ඒකනායක, ඊ. එම්. වයි. | ... | 51 | | |
| 3. | ගුණසේකර, සේ. ප. | ... | 53 | | |
| 4. | පෝල් රේමන්, ඩබ්. ඩී. | ... | 54 | | |
| 5. | මාරසිංහ, එන්. කේ. | ... | 58 | | |
| 6. | පෙරේරා, ඒ. ජී. එම්. | ... | 63 | | |
| 7. | සේනාධීර, ඩී. ඩී. එම්. ආර්. | ... | 69 | | |
| 8. | ගුණසේන, කේ. පී. | ... | 71 | | |
| 9. | අප්පුහාමි, එම්. ඒ. එච්. | ... | 75 | | |
| **3 වැනි පංතිය (වාදනය)** | | | | | |
| 1. | සුමනාවතී, ආර්. එම්. ඒ. | ... | 43 | ... | එස්රාජය |
| 2. | අප්පුහාමි, එම්. ඒ. එච්. | ... | 75 | ... | සිතාරය |
| 3. | විජේසිංහ, බී. ඒ. | ... | 84 | ... | එස්රාජය |
| 4. | ජයසුන්දර, ඩබ්. එස්. | ... | 91 | ... | වයලීනය |
| 5. | කුලරත්න, කේ. ඩී. | ... | 93 | ... | වයලීනය |
| 6. | නාරන්ගොඩ, ඩී. එස්. | ... | 97 | ... | වයලීනය |
| 7. | පුණ්‍යසිරි, එම්. ඩී. | ... | 100 | ... | තබ්ලාව |

පහත නම් සඳහන් අයදුම්කරුවෝ රජයේ සංගීත විද්‍යාලයයේ මධ්‍යම පරීක්ෂණයෙන් සමත්ය හ.

| | නම | | විභාග අංකය | | භාණ්ඩය |
|---|---|---|---|---|---|
| **1 වැනි පංතිය (ගායනය)** | | | | | |
| 1. | ආතාවුද, ජී. ආර්. බී. | ... | 21 | | |
| **1 වැනි පංතිය (වාදනය)** | | | | | |
| 1. | විමලසිරි රුද්‍රිගු, එම්. ඩී. | ... | 20 | ... | වයලීනය |
| 2. | ආතාවුද, ජී. ආර්. බී. | ... | 21 | ... | වයලීනය |
| **2 වැනි පංතිය (ගායනය)** | | | | | |
| 1. | ඩයස්, ශා. ර. | ... | 2 | | |
| 2. | කහවලගේ, මා. ශ්‍රී. | ... | 3 | | |
| 3. | ධර්මදාස, එම්. ඩබ්. | ... | 8 | | |
| 4. | ජෙනට් සෝමලතා, ඩී. | ... | 15 | | |
| 5. | නන්දවතී මැණිකේ, එස්. එම්. | | 19 | | |
| 6. | මැදගංගොඩ, ඩී. ඩබ්. | ... | 27 | | |
| 7. | නන්දවතී, කේ. | ... | 29 | | |
| 8. | ආතාවුද ආරච්චි, ඩී. ඩී. එන්. | | 38 | | |
| **2 වැනි පංතිය (වාදනය)** | | | | | |
| 1. | ඩයස්, ශා. ර. | ... | 2 | ... | එස්රාජය |
| 2. | කහවලගේ, මා. ශ්‍රී. | ... | 3 | ... | එස්රාජය |
| 3. | ජයසිංහ, සු. | ... | 4 | ... | එස්රාජය |
| 4. | වර්ණසූරිය, එස්. ටී. | ... | 5 | ... | එස්රාජය |
| 5. | සයිමන්, එම්. එන්. | ... | 11 | ... | සිතාරය |
| 6. | ප්‍රේමදාස, එස්. ඩී. | ... | 13 | ... | බටනලාව |
| 7. | කරුණාරත්න, කේ. වී. | ... | 14 | ... | වයලීනය |
| 8. | ජෙනට් සෝමලතා, ඩී. | ... | 15 | ... | වයලීනය |
| 9. | සිරිමාවතී, ඩබ්. පී. | ... | 16 | ... | වයලීනය |
| 10. | ලැම්බට්, ජේ. | ... | 23 | ... | වයලීනය |
| 11. | මැදගංගොඩ, ඩී. ඩබ්. | ... | 27 | ... | වයලීනය |
| **3 වැනි පංතිය (ගායනය)** | | | | | |
| 1. | ජයසිංහ, සු. | ... | 4 | | |
| 2. | සිරිමාවතී, ඩබ්. පී. | ... | 16 | | |
| **3 වැනි පංතිය (වාදනය)** | | | | | |
| 1. | විජේවර්ධන, කේ. එස්. එස්. | | 1 | ... | එස්රාජය |
| 2. | පියසීලි චන්ද්‍රලතා, ජී. කේ. | | 6 | ... | එස්රාජය |
| 3. | කස්තුරි ආරච්චි, ජී. ඩබ්. | ... | 12 | ... | සිතාරය |
| 4. | නන්දවතී මැණිකේ, එස්. එම්. | | 19 | ... | වයලීනය |

පහත නම් සඳහන් අයදුම්කරුවෝ රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලය යේ පහත දක්වෙන පරීක්ෂණවලින් සමත්ය හ.

**පරීක්ෂණය : උපාධි අවසාන උඩරට නැටුම් විභාගය**

**1 වැනි පංතිය**

කිසිවෙකු නැත.

| | නම | | විභාග අංකය |
|---|---|---|---|
| **2 වැනි පංතිය** | | | |
| 1. | විජේසිංහ, එම්. ජී. | ... | 6 |
| 2. | කැරොලින් රීටා, එම්. ඒ. | ... | 27 |
| **3 වැනි පංතිය** | | | |
| 1. | පියසේන, එම්. ... | ... | 1 |
| 2. | චාර්ලිස් සිංඤෝ, ඩබ්. ඒ. | ... | 3 |
| 3. | ගුණසේන, ඒ. ... | ... | 5 |
| 4. | නන්දසේන, කේ. ජී. | ... | 7 |
| 5. | ගුණතිලක, එම්. වී. | ... | 8 |
| 6. | පියදාස, ඒ. කේ. ... | ... | 9 |
| 7. | ඉන්ද්‍රරත්න, ජේ. ඒ. | ... | 10 |
| 8. | ප්‍රේමලතා පෙරේරා, ඩබ්. ඒ. එන්. | ... | 12 |
| 9. | චන්ද්‍රවතී සමරසිංහ, එම්. ඒ. ඩී | ... | 13 |
| 10. | ඩයනා ද සිල්වා, යූ. ඩබ්. | ... | 14 |
| 11. | රණසිංහ, ආර්. ... | ... | 15 |
| 12. | ඩොලී මැණිකේ, ඩබ්. එස්. | ... | 16 |
| 13. | කරුණාවතී, ඩබ්. ඩී. | ... | 22 |
| 14. | ආරියවතී, එච්. ඒ. | ... | 23 |
| 15. | සෝමලතා, පී. එන්. | ... | 24 |
| 16. | චන්ද්‍රවතී, ආර. ආර්. ඒ. ඩී. | ... | 25 |
| 17. | ශ්‍රියාවතී, ජී. ඩී. ... | ... | 26 |
| 18. | ජනශාන්ති, එස්. ... | ... | 28 |
| 19. | විතාරණ, වී. එස්. ... | ... | 32 |

**පරීක්ෂණය : උපාධි අවසාන පහත රට නැටුම් විභාගය**

**1 වැනි පංතිය**

කිසිවෙකු නැත.

| | නම | | විභාග අංකය |
|---|---|---|---|
| **2 වැනි පංතිය** | | | |
| 1. | නන්දවතී, ඩබ්. එල්. ඒ. | ... | 36 |
| 2. | විනිෆ්‍රෙඩ්, ඩබ්. ඒ. ඩී. | ... | 37 |
| 3. | ඥානවතී, එම්. ... | ... | 38 |
| 4. | පියසීලි, ඩී. ... | ... | 40 |
| 5. | ගුණතිලක, පී. ඒ. ... | ... | 42 |
| 6. | මාටින්, කේ. ඒ. පී. | ... | 43 |
| 7. | ජයසිංහ, එච්. එම්. | ... | 44 |
| 8. | ඒබ්‍රහම්, ඩබ්. ඒ. ඩී. | ... | 45 |
| **3 වැනි පංතිය** | | | |
| 1. | ප්‍රේමවතී, එම්. ඩබ්. ඒ. | ... | 35 |
| 2. | සෝමාවතී, එච්. වී. | ... | 39 |
| 3. | විජේදාස, ඊ. ... | ... | 41 |

**පරීක්ෂණය : උඩරට නැටුම් මධ්‍යම හෝ සහතික පත් විභාගය**

**1 වැනි පංතිය**

කිසිවෙකු නැත.

| | නම | | විභාග අංකය |
|---|---|---|---|
| **2 වැනි පංතිය** | | | |
| 1. | ධර්මසේන, ජී. ... | ... | 57 |
| 2. | මුතුබණ්ඩා, එච්. එම්. | ... | 58 |
| 3. | රන්හාමි, කේ. එම්. | ... | 61 |
| **3 වැනි පංතිය** | | | |
| 1. | කුමාරසිංහ, කේ. එස්. එම්. පී. | ... | 46 |
| 2. | ටෙසි විතාන, ටී. වී. | ... | 47 |
| 3. | කුසුමාවතී, එම්. ... | ... | 48 |
| 4. | මැගිලින්, කේ. ඩී. | ... | 49 |
| 5. | සීලවතී, යූ. එල්. ... | ... | 50 |
| 6. | බේබිනෝනා, එම්. | ... | 51 |
| 7. | ජේමතිලක, ආර්. එම්. ඒ. | ... | 53 |
| 8. | සෝමරත්න, ජී. ආර්. | ... | 59 |
| 9. | ස්ටැන්ලි ශ්‍රේෂන්, එම්. ඒ. | ... | 60 |
| 10. | විජේතුංග, එච්. ආර්. | ... | 63 |
| 11. | සෝමසිරි, එච්. ඒ.... | ... | 66 |

**පරීක්ෂණය : පහතරට නැටුම් මධ්‍යම හෝ සහතික පත් විභාගය**

| | නම | | විභාග අංකය |
|---|---|---|---|
| **1 වැනි පංතිය** | | | |
| 1. | පීරිස්, පී. ජී. ... | ... | 68 |
| **2 වැනි පංතිය** | | | |
| 1. | පොඩිනෝරිස්, ඩබ්ලිව්. | ... | 69 |

**3 වැනි පංතිය**

කිසිවෙකු නැත.

කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය,
(විභාග කොමසාරිස්).

1969 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුවේ දීය.

10–779—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය—කැලණිය

### 1970 ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය (බාහිර)

ඉහත සඳහන් පරීක්ෂණය සඳහා ඉල්ලුම් පත් 1969. 11. 30 දින දක්වා බාරගනු ලැබේ. අවශ්‍ය ඉල්ලුම්පත් විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය කාර්යාලයෙන් (විභාග හා ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ අංශයෙන්) ලබාගත හැකිය.

සුදුසුකම්: සෑම අයදුම්කරුවෙක්ම අ. පො. ස. (උසස් පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් එකවර විෂයයන් තුනකින්වත් සමත්ව සිටිය යුතුයි.

1. තවද, අ. පො. ස. (උසස් පෙළ) විභාගයෙන් සමත්වීමට පෙර අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් එකවර සම්මාන තුනක් සහිතව විෂයයන් හයකින් සමත්වීම හෝ එසේ ලබන ලද සම්මාන සහිතව එකවර විෂයයන් පහකින් සමත්ව පසු වාරයකදී ස වැනි විෂයෙන් සමත් වීම. මෙම විෂයයන් අතර (අ) සිංහල, (ආ) අංක ගණිතය, මූලික ගණිතය, ගණිතය, වාණිජ අංක ගණිතය යන විෂය අතුරෙන් එකක් සමත්ව සිටිය යුතුය. (අපේක්ෂකයා ඉහත සඳහන් කවර පරීක්ෂාවකදී හෝ යටත් පිරිසෙයින් එක් විද්‍යා විෂයකින් වත් සමත්ව සිටිය යුතුයි.)

2. ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන ප්‍රාරම්භ පරීක්ෂාවෙන් සමත්වීම (පැවිදි ශිෂ්‍යයින් සඳහා පමණයි.

3. වයස අවුරුදු 25 ඉක්ම වූ වැඩිහිටි ශිෂ්‍යයෝ ඉහත සඳහන් (1) (2) කොටස්වල අවශ්‍යතාවලින් නිදහස් වෙති. එහෙත් ඔවුන් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී හෝ විද්‍යා විෂයකින් සාමර්ථ්‍යය ලැබූවන් විය යුතුයි. නැතහොත් සනාතන සභාව පිළිගත් වෘත්තීය සුදුසුකමක් ලැබූවන් විය යුතුය.

ඉල්ලුම් පත් ලබා ගැනීම කාර්‍යාලයට පැමිණ හෝ තැපැල් මගින් කල හැකි අතර තැපැල් මගින් ගෙන්වා ගැනීමට ලිපිනය ලියූ ශත 10 ක මුද්දර සහිත, 9"×4" ප්‍රමාණ කවරයක්, ලේකම්, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය, කැලණිය, යන ලිපිනයට එවිය යුතුය. තැපැල් මගින් නොවැම්බර් 25 දින දක්වා ද, කාර්යාලයට පැමිණෙන්නේ නම් නොවැම්බර් 30 වෙනි දින දක්වාද ඉල්ලුම් පත් ලබාගත හැකිය.

ජී.අමරසේන,
ලේකම්.

10-704

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### භෛෂජ්‍යයන් ලෙස පුහුණු කිරීමේ පාඨමාලාවට බඳවා ගැනීම
### ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය

භෛෂජ්‍යයන් ලෙස පුහුණු කිරීම සම්බන්ධයෙන් 1969 සැප්තැම්බර් මස 26 වැනි දින අංක 14,873 ගැසට් පත්‍රයේ 1659 පිටුවේ පළවූ නිවේදනයට අමතරවයි.

2. එම නිවේදනයේ 2 වන ඡේදයේ සඳහන් පරිදි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය ලෙස 1969 ඔක්තෝම්බර් මස 5 වන දින නියමකර ඇතත්, ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1969 ඔක්තෝම්බර් මස 31 දින දක්වා, දීර්ඝකර ඇති බව මින් නිවේදනය කරමි.

3. ඉල්ලුම් පත්‍ර කලින් නිවේදනයේ ආකෘතිය අනුවම ඉදිරිපත් කළ යුතුයි.

විද්‍යාලය.ධිපති.

රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයය,
බණ්ඩාරනායක පුර,
රාජගිරිය.
1969 ඔක්තෝම්බර් මස 8 වෙනිදා.

10-797

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

මගේ අංකය : ඉප/260 (69/70)

## ගාලු කච්චේරිය

ගාලු දිස්ත්‍රික්කයේ පහත උප ලේඛනයේ සඳහන් තැනීම් වැඩ සඳහා 1969 නොවැම්බර් මස 11 වැනි අඟහරුවාද ප. ව. 2.30 වන තෙක් ගාල්ලේ දිසාපති තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. එදින එකී වේලාවට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. එම ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය ගාල්ලේ උප දිසාපතිගේ කාර්‍යාල කාමරයේ තබනු ඇත. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු වේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ගාල්ලේ දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩ පිළිබඳ සැලසුම් පූර්වෝක්ත දිසාපති කාර්යාලයේ දී බැලිය හැකි වන අතර, ඒ පිළිබඳ සියලු විස්තර ඔහු වෙතින් ලබාගත හැක.

3. පහත සඳහන් ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩි මුදලකට කොන්ත්‍රාත් වැඩ සඳහා රජයේ ලියාපදිංචි වී ඇති පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට හා රජයේ වැඩ, වාරිමාර්ග හෝ වෙනත් දෙපාර්තමේන්තුවල ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති, මෙවැනි වැඩ හොඳින් කිරීමට හැකියාවක් තිබෙන සමූපකාර හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ද මෙම වැඩ සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඒ වෙනුවෙන් ඉහත සඳහන් දිසාපති වෙත එසේ ලියා පදිංචිවී තිබීම හා හැකියාව පිළිබඳ සාධකත්, රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා වූ කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 1969 නොවැම්බර් මස 6 වැනි දින ප. ව. 3.00 දක්වා වන්නේය. ලියාපදිංචි සමිති විසින් ටෙන්ඩර් තැන්පත් තැබීම අවශ්‍ය නො වේ. එහෙත් ඒ ඒ සමිතිවලට අදල දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික්ක ප්‍රධානීන්ගෙන් ලබාගත් තමන්ගේ හැකියාවන් පිළිබඳ සහතික මා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයේ හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයක දී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ දී හෝ ගෙවීමට පිළිවන.

5. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙලවරේ " .................................................................................... සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් විය යුතු අතර, සියලුම ටෙන්ඩර් පත්‍ර අත්සන් තබා සීල් කර, සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතු යි.

ඩබ්. එල්. ආර්. බී. ද අල්විස්,
උප දිසාපති,
ගාල්ලේ දිසාපති වෙනුවට.

1969 ඔක්තෝබර් මස 7 වෙනි දින,
ගාල්ලේ දිසාපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| වැඩ විස්තරය | පිහිටි ප්‍රදේශය | ලියා පදිංචි වී තිබිය යුතු මුදල රු. |
|---|---|---|
| 1. උඩවැලිවිටිය උස්බිම් ජනපද ප්‍රවේශ ප්‍රවේශ පාර (කොටසක්) | හිනිදුම් පත්තුව... | 15,000 |
| 2. උඩවැලිවිටිය උස්බිම් ජනපදයේ ජලනල ව්‍යාපාරය | එම ... | 15,000 |
| 3. ඕපාත වීරපාන 2වැනි සැතපුම අළුත් වැඩියාව | එම ... | 15,000 |

10–693

---

අංකය : ඉප/260 (69/70)

## ගාලු කච්චේරිය

ගාලු දිස්ත්‍රික්කයේ පහත උප ලේඛනයේ සඳහන් තැනීම් වැඩ සඳහා 1969 නොවැම්බර් මස 11 වැනි අඟහරුවාද ප. ව. 2.30 වන තෙක් කොළඹ (තැ. පෙ. 500) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. එම ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය ගාලු මුවදෙර මහ ලේකම් කාර්යාලයේ තුන්වෙනි තට්ටුවේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබනු ඇත. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු වේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ගාල්ලේ දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩ පිළිබඳ සැලසුම් පූර්වෝක්ත දිසාපති කාර්යාලයේ දී බැලිය හැකි වන අතර, ඒ පිළිබඳ සියලු විස්තර ඔහු වෙතින් ලබා ගත හැක.

3. පහත සඳහන් ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩි මුලදකට කොන්ත්‍රාත් වැඩ සඳහා රජයේ ලියාපදිංචි වී ඇති පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට හා රජයේ වැඩ, වාරිමාර්ග, අධ්‍යාපන හෝ වෙනත් දෙපාර්තමේන්තුවල ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වාඩියෙන් ලියාපදිංචි වී ඇති, මෙවැනි වැඩ හොඳින් කිරීමට හැකියාවක් තිබෙන සමූපකාර හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ද මෙම ැඩ සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඒ වෙනුවෙන් ඉහත සඳහන් දිසාපති වෙත එසේ ලියා ලියාපදිංචි වී තිබීම හා හැකියාව පිළිබඳ සාධකත්, රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා වූ කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 1969 නොවැම්බර් මස 3 වැනිද ප. ව. 3.00 දක්වා වන්නේය. ලියා පදිංචි සමිති විසින් ටෙන්ඩර් තැන්පත් තැබීම අවශ්‍ය නොවේ. එහෙත් ඒ ඒ සමිතිවලට අදාල දෙපාර්ත මේන්තුවල දිස්ත්‍රික්ක ප්‍රධානීන්ගෙන් ලබාගත් තමන්ගේ හැකියාවන් පිළිබඳ සහතික මා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයේ හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ දී හෝ ගෙවීමට පිළිවන.

5. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ " උඩවැලපිටිය උස්බිම් ජනපද ප්‍රවේශපාර බෝක්කු තැනීම " සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් විය යුතු අතර, සියලුම ටෙන්ඩර් පත්‍ර අත්සන් තබා සීල් කර, සුරක්ෂතව ඉදිරිපත් කළ යුතුයි.

ඩබ්. එල්. ආර්. බී. ද අල්විස්,
උප දිසාපති,
ගාල්ලේ දිසාපති වෙනුවට.

1969.10.6 දින,
ගාල්ලේ, දිසාපති කාර්යාලයේ දී ය.

| | වැඩ විස්තර | පිහිටි ප්‍රදේශය | ලියා පදිංචි වී තිබිය යුතු මුදල රු. |
|---|---|---|---|
| 1. | උඩවැලිපිටිය උස්බිම් ජනපද ප්‍රවේශ පාර බෝක්කු තැනීම | ගිනිදුම් පත්තුව... | 20,000 |

10–694

---

වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කුරුණෑගල උප කොට්ඨාශය

කුරුණෑගල උප කොට්ඨාශයේ පහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1969 නොවැම්බර් 11 වෙනි අඟහරුවාදා පෙ.ව. 10.00 දක්වා කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ. :—

| වැඩ විස්තරය | | ටෙන්ඩර්කරුගේ ලියාපදිංචි මුදල රු. ශ. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|---|
| (1) මාරපහඹිය බැම්ම | ... | ... 35,000 0 ... | 50 0 |
| (2) මාහරගම බැම්ම | ... | ... 25,000 0 ... | 25 0 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දැක්වෙන ප්‍රමාණයට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1969 නොවැම්බර් මස 7 වෙනි සිකුරාදා (අදින ඇතුළුව) කාර්යාල වේලාව තුළදී කුරුණෑගල/නිකවැරටිය/පුත්තලම උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිපත් වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත් ස හ ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන පිළිවෙළට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියළුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැළසුම, විශේෂ විස්තර යනාදිය කාර්යාල වේළාවන් තුළදී කුරුණෑගල උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එල්. හරිදස,
වාරිමාර්ග ඉංජිනේරු,
කුරුණෑගල උප කොට්ඨාශය

1969 ඔක්තෝබර් මස 6 වෙනි දින,
කුරුණෑගල, වාරිමාර්ග කාර්යාලයේ දී ය.

10–644

---

පුත්තලම උප කොටසේ පහත සඳහන් වැඩ සඳසා වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1969 නොවැම්බර් මස 4 වෙනි අඟහරුවාද පෙ. ව. 10.00 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

| අංකය | වැඩෙහි නම | ලියාපදිංචි වියයුතු ගණන රු. ශ. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | මාසයට වැඩ කලයු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | මහඅන්දර වැව වැඩිදියුණු කිරීම | 35,000 0... | 50 0... | 20 |

1. මෙම දෙපාර්තිමේන්තුවේ ඉහත සඳහන් ගණනට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනට සහ විවිධ සේවා සමූපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කල හැක.

2. 1969 ඔක්තෝබර් මස 19 වෙනිද සිට ඔක්තෝබර් 30 වෙනි දින දක්වා සාමාන්‍ය කායඝාලීය වේලාවන් තුළදී පුත්තලම, නිකවැරටිය, උප කොටස් භාර වාරිමාර්ග කායඝාලවලින් ලබා ගතහැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කල යුතුය. ටෙන්ඩර්පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කල යුතුය. පෝර්ම කොල නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් ගණනට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

3. මෙ ටෙන්ඩරය ගැන සියලු විස්තර කායඝාල වේලාවන් තුල දී පුත්තලම උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ න් ලබාගත හැක.

ක. යෝගනාදන්,
වාරිමාර්ග ඉංජිනේරු, පුත්තලම

1969 ඔක්තෝබර් 4 වෙනිද,
පුත්තලම වාරිමාර්ග කායඝා ලයේදී.

10–700

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තැන විසින් 1969 ඔක්තෝබර් මස 23 වන දින පස්වරු 2.30 දක්වා පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් (පිටපත් 2 කින් යුතුව) භාරගනු ලැබේ.

1. ගබඩා ගොඩනැගිල්ල—මීගමුව පිඟන් කම්හල.

2. ආපන ශාලා ගොඩනැගිල්ල—පිළියන්දල පිඟන් කම්හල.

රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ ස්ථාපිත සංස්ථාවක පිළිවෙලින් රු. 1,00,000 ක සහ රුපියල් 50,000 ක වටිනාකම් ඇති ගොඩනැගිල්ලක් සතුටුදායක ලෙස තනා ඇති බවට සාධක ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්කරුවන් වෙත, මෙම වැඩවලට අදාළ ටෙන්ඩර් ලියකියවිලි 1969 ඔක්තෝබර් මස 21 වන දින දහවල් 12 දක්වා පහත අත්සන් කරනු ලබන අය විසින් නිකුත් කරනු ලැබේ.

එක් එක් ටෙන්ඩරය සඳහා ආපසු ගෙවන රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් සහ ආපසු නොගෙවන රු. 25 ක ටෙන්ඩර් ගාස්තුවක් මුදලින් තැන්පත් කළ යුතුය.

ටෙන්ඩරය පිරිනැමීමෙන් තෙමසක කාලයක් ඇතුලතදී කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කළ හැ කිඅය පමණක් ටෙන්ඩර් පත් ලබාගත යුතුවේ.

සැපයීම් කළමනාකරු.
ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් හා වාප්පු දෙපාර්තමේන්තුව, 'ඍංංංං ශුභු ෆෘඉ 'දුදු ඝංඃ
කොළඹ 7.

10-703

යොමුව : පී.එස්.සී. 2/28/69

රජයේ ටෙන්ඩර්

සෙ/බ්‍ය දෙපාර්තමේන්තුව

ස්පිරෙනොලැක්ටෝන් පෙති ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෙ/බ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ස්පිරෙනොලැක්ටෝන් පෙති ආදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(I) අංක 14,843 දරණ 1969 පෙබරවාරි මස 28 වැනි දිනැති " රජයේ ගැසට් පත්‍රයේ " පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්,

(II) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(¡II) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(I–) ඕස්ට්‍රයාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමෙනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ.පෙ. 584, අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 දෙසැම්බර් මස 19 සිකුරාද පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරය අදල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ,

(I) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡෙදයේ ?– වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වෙලාවට නියමිත ස්ථාන යේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීනස් පාරේ අංක : 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යකිෂ (සැයයීම්) ගෙන් ලබාගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්
සෙ/බ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1969 ඔක්තෝබර් 4 වැනි දින,

SCHEDULE REFERRED TO

| Item No. | Description | Estimated requirement | Packing required |
|---|---|---|---|
| 1 .. | Spirenolactone (e.g. Aldactone) 25 mgm each | 130,000 Tablets | In bottles of 100 tablets |
| 2 .. | Multivitamin each tablet containing at least : 2500 I.U. Vitamin 'A' .. 1 mgm Aneurin Hydrochloride (Vit. B1) 1 mgm Riboflavin (Vit. B2) 10 mgm Nicotinamide 25 mgm Acid Ascorbic (Vit. C) 300 Units Vit. D Antirachiatic Activity | 80,000,000 Coated tablets (to withstand tropical conditions) | In polythen bags inseeted in levelid tins or 5000tablets |
| 3 .. | Sulphadiazine B.P. 0.5. gm | 3,500,000 Tablets | In lined sealed tins of 1000 tablets |
| 4 .. | Sulphadimidine B.P. 0.5 gm | 40,000,000 Tablets | do. |
| 5 .. | Fortified Procaine Penicillin G Injection B.P. each vial containing : Procaine Penicillin G 300,000 Units Crystalline Penicillin G. 1000,000 Units | 630,000 Vials | In any convenient packing |
| 6 .. | Chloramphenicol Sodium Succinate equivalent to 1 gramme of Chloramphenicol B.P. suitable for both intramascular and intravenous use (each vial labelled accordingly) | 28,000 Vials .. | In boxes of 100 vials |
| 7 .. | Phenoxymethyl Penicillin B.P. 125 mgm (Penicillin V) | 6,000,000 Tablets | In corked screw capped bottles of 1000 tablets |
| 8 .. Neomycin 8 .. | Neomycin Sulphate 0.5 gm each | Tablets | 500 tablets |

–546

---

ලංකා ගමනාගමන මණ්ඩලය

## ඇලුමිනියම් කැබලි විකිණීම—අපහරණ අංගනය, වේරහැර, බොරලැස්ගමුව

වේරහැර, බොරලැස්ගමුවේ ලං. ග. ම. අපහරණ අංගනයේ තිබෙන පවිත්‍ර හා සායම් තැවරුනු අබලි ඇලුමිනියම් කැබලි මිළයට ගෙන හැර ගෙනයාම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් 69. 11. 3 දින පෙ. ව. 10.00 වනතෙක් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින් බාරගනු ලැබේ. විකිණීමට තිබෙන අබලි ඇලුමිනියම්වල ප්‍රමාණයන් මෙසේ ය :—

(ඒ) පවිත්‍ර ඇලුමිනියම් කැබලි—ටොන් 19—හො. .08 ක පමණ ප්‍රමාණයක්.

(බී) සායම් තැවරුණු ඇලුමිනියම්—ටොන් 25. හො. 08 ක පමණ ප්‍රමාණයක්.

එනමුත්, මිළදී ගැනීමට බලාපොරොත්තු වන ගැනුම්කරුවන්ට හොණ්ඩරය බැගින් මිළ සඳහන් කර තමන්ට අවශ්‍යවන පරිදි කුඩා හෝ ලොකු ප්‍රමාණයකට ටෙන්ඩර ඉදිරිපත් කළ හැක.

ටෙන්ඩර පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත ඇලුමිනියම් ටොන් එකක් දක්වා කුඩා ප්‍රමාණයක් ගැනීම සඳහා මුදලින් රු. 100 බැගින් වූද, උපරිම වශයෙන් රු. 1000 දක්වා වූ ද මුදලක් තැන්පත් කර ලබාගන්නා රිසිට්පත මගේ කායර්‍යාලය වෙත ඉදිරිපත් කළ විටය. ටෙන්ඩර භාර ගන්නා අවසාන දිනයට පෙර දින දහවල් 12.00 වනතෙක් ටෙන්ඩර පත්‍ර නිකුත් කරනු ලැබේ. වැඩ කරන සාමාන්‍ය කාලයතුල බොරලැස් ගමුවේ වේරහැර අපහරණ අංගනයේදී මෙම ද්‍රව්‍ය පරීක්ෂා කළ හැක.

වැඩි විස්තර මාගේ කායර්‍යාලයෙන් ලබාගත හැකිය.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන.

සම්පාදක කොට්ඨාශය,
200, කිරුළ පාර,
කොළඹ 5.

10–720

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථාන ගොඩනැගීම

පහත සඳහන් ස්ථානවල ව්‍යාප්ති මධ්‍යස්ථාන ගොඩනැගිලි තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.11.11 වෙනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ. පහත සඳහන් එක් එක් ගොඩනැගිල්ලක් සඳහා වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අතර එක් අයෙකුට එක ගොඩනැගිල්ලක් හෝ වැඩි ගණනක් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

1. මැදිරිගිරිය.
2. මහියංගනය.
3. මහඔය (මොනරාගල දිස්ත්‍රික්කය).
4. කැබිතිගොල්ලෑව.
5. යටියන (මාතර දිස්ත්‍රික්කය).

2. නාරාහේන්පිට, පළතුරු වින් කිරීමේ කර්මාන්තශාලා පාරේ, පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සිවිල් ඉංජිනේරු කාර්යාලයේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද, ලබා ගත හැක.

3. ටෙන්ඩර් කරුවන් රු. 30,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්ත

මේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1969.10.30 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙනුවට.

1969.10.8 වෙනි දින,
නාරාහේන්පිට, පළතුරු වින් කිරීමේ
කර්මාන්තශාලා පාරේ, පිහිටි
කෘෂිකර්ම දෙපාතීමේන්තුවේ,
සිවිල් ඉංජිනේරු කාර්යාලයේදී ය.

10-792

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පශු වෛද්‍ය බෙහෙත් ශාලා සෑදීම

පහත සඳහන් ස්ථානවල පශු වෛද්‍ය බෙහෙත් ශාලා තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.11.11 වෙනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ. පහත සඳහන් එක් එක් ගොඩනැගිල්ලක් සඳහා වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අතර එක් අයෙකුට එක ගොඩනැගිල්ලක් හෝ වැඩි ගණනක් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

1. පොයින්ට් පේද්‍රු.
2. මොනරාගල.
3. වේයන්ගොඩ.
4. කහටගස් ඩිගිලිය.
5. කුරුණෑගල.

2. නාරාහේන්පිට, පළතුරු වින් කිරීමේ කර්මාන්තශාලා පාරේ, පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සිවිල් ඉංජිනේරු කාර්යාලයේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද, ලබා ගත හැක.

3. ටෙන්ඩර් කරුවන් රු. 30,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1969.10.30 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙනුවට.

1969.10.8 වෙනි දින,
නාරාහේන්පිට, පළතුරු වින් කිරීමේ
කර්මාන්තශාලා පාරේ, පිහිටි
කෘෂිකර්ම දෙපාතීමේන්තුවේ,
සිවිල් ඉංජිනේරු කාර්යාලයේදී ය.

10-793

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

මඩකලපු දිස්ත්‍රික්කයේ තොටුපොල රේන්ද නැවත විකිණීම

1969/70

1969 නොවැම්බර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ තොටුපල රේන්ද විකිණීම කොන්දේසිවලට යටත්ව, මඩකලපුව දිස්ත්‍රික්කයේ මෙහි පහත සඳහන් තොටුපලවල ගෙවිය යුතු රේන්ද ලබා ගැනීමේ සහ අයකිරීමේ තනි අයිතිය මිළදී ගැනීම සඳහා ටැන්ඩර්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. එක් එක් ටෙන්ඩර් පත්‍රය සඳහා රු. 100 ක තැන්පත් මුදලක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ප ත්‍රයට ඇමිණිය යුතුය. ඒ ඒ ටෙන්ඩර් පත්‍රය සම්බන්ධයෙන් රු. 100 යේ මුදල තැන්පත් කළ බවට කුවිතාන්සිය මඩකලපුව කච්චේරියට 1969.10.21 වැනි දිනට පෙර ඉදිරිපත් කර ගලබාගත් පෝර්මවල ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම, සිල් තබන ලද ලියුම් කවරයක බහා එම ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "මඩකලපුව දිස්ත්‍රික්කයේ (තොටුපලේ නම)..........................තොටුපල රේන්දය සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර, ටෙන්ඩර්පත් භාරගැනීමට අවසාන කිරීමට නියම කර ඇති වේලාවට පෙර මඩකඩුපුවේ දිසාපති තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. 1969 ඔක්තෝබර් 22 වැනි දින මෙහි පහත සඳහන් වේලාවලදී ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් භාරගැනීම අවසාන කරන වේලාවේ දී ටෙන්ඩර් පදි කරුවන් මේ දිසාපති කාර්යාලයට පැමිණ සිටිය යුතුය. සෑම ටෙන්ඩර්පත් කරුවෙකු විසින්ම ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කරනු ලබන කොන්ත්‍රාත්තුව කරගෙන යෑම සඳහා ධන ශක්තිය තිබෙන බවට සහතිකයක් තම ප්‍රදේශයේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් හෝ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගෙන් ලබාගෙන ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී ඉදිරිපත් කළ යුතුය. විවිධ සේවා සමුපකාර සමිති මගින් ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පත් සඳහා එම සමිතියට මෙම කොන් ත්‍රාත්තුව නිසියාකාරව ගෙන යාමට මුදල් තත්ත්වය අතින් හැකියාවක් ඇති බවද, පහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් පෝර්මයක් සමග නියමිත ඇප මුදල සම් පූර්ණයෙන් ම තැන්පත් කිරීමට ශක්තියක් ඇති බවට, තම ප්‍රදේශයේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තැන ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

5. අයිතිය මිළදී ගත් බවට ප්‍රකාශ කළ වහාම තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරු විසින් තොටපල රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි අත්සන් කර ඇප තැන්පත් මුදල වශයෙන් මිළදී ගත් මුදලෙන් තුනෙන් පංගුවකට සමාන මුදලක් මඩකලපුවේ දිසාපති තැනට ගෙවිය යුතුය.

6. අයිතිය මිලදී ගත් තැනැත්තා වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ යම්කිසි ටෙන්ඩර්පත් කරුවකු මෙන්ඩර්පත් කොන්දේසි අත්සන් කිරීමට ප්‍රතික්පෙප කළහොත් හෝ අවශ්‍ය ඇපය තැන්පත් කිරීමට අසමත් වුවහොත් හෝ ඇප ඔප්පුව ක්‍රියාතිමක කිරීම සඳහා අවශ්‍ය මුදල් තැන්පත් කිරීමට අසමත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල අහිමිකර, මින් ඉදිරියේදි ආණ්ඩුවේ කිසිම කොන් ත්‍රාත්තුවක් කිරීමට නො හැකි ලෙස ප්‍රකාශ කරනු ලැබේ. මෙම කොන්දේසිවලට යටත්ව, තෝරාගත් ටෙන්ඩර්පත් කරු හෝ ටෙන්ඩර්පත් කරුවන් විසින් ඉහත සඳහන් තොටුපල රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කර ඇප මුදල තැන්පත් කළ පසු ටෙන්ඩර්පත්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

7. කිසිම හේතුවක් සඳහන් නොකර ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය දිසාපති තැන වෙත පැවරී තිබේ.

8. දුනට බෝට්ටු වැඩ කරන තොටුපලවලට බෝට්ටු සපයනු ලැබේ. ලබාගැනීමට හැකි අවස්ථාවලදී කුඩා බෝට්ටු (වල්ලම්) සපයනු ලැබේ. රජයෙන් සැපයීමට කුඩා බෝට්ටු නැති අවස්ථාවලදී තොටුපලේ සාර්ථක ලෙස වැඩ කිරීම සඳහා තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින්ම කුඩා බෝට්ටු සපයාගත යුතුය.

9. තොටුපල රේන්ද කොන්දේසි අනුව, තැපැල් ගෙන යාමට තැපැල් පණිවුඩකරුවන් සහ රජයේ වාහන වලට තොටුපල කුළි ගෙවිය යුතු නැත. තෝරාගත් ටෙන්ඩර්පත්කරුවන් තැපැල් පණිවුඩකරුවන්ගෙන් සහ රජයේ වාහන වලින් තොටුපල කුලී අයකිරීම නොකල යුතුය.

10. අවශ්‍ය වැඩි විස්තර මඩකලපුවේ දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

එඩ්ගාර් ප්‍රනාන්දු,
මඩකලපු දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.

1969 ඔක්තෝබර් මස 4 වැනි දින,
මඩකලපු දිසාපති කාර්යාලයේ දීය.

| තොටුපලේ නම | තොටුපල පිහිටි ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය | ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන වේලාව |
|---|---|---|
| වලයරව් ... | මන්මුනෝපත්තු උතුර ... | 10.00 |

10—565

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1969**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | ... | 69. 9. 5 සිකුරාද | ... | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.12 සිකුරාද | ... | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3 30 |
| | | 69. 9.19 සිකුරාද | ... | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.26 සිකුරාද | ... | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.17 සිකුරාද | ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.24 සිකුරාද | ... | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.10.31 සිකුරාද | ... | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | ... | 69.11. 7 සිකුරාද | ... | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.11.14 සිකුරාද | ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.11.21 සිකුරාද | ... | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.11.28 සිකුරාද | ... | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | .. | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි

# තනතුරු – ඇබෑර්තු – සම්බන්ධයි

අංකය : ඒ්. 93/එක්ස්. 2157/69

## පළාත් පාලන අමාත්‍යංශයේ ජලසම්පාදන ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය ඉංජිනේරු (සිවිල්) තනතුරු

පළාත් පාලන අමාත්‍යංශයේ ජලසම්පාදන ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ ඉංජිනේරු (සිවිල්) තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන් හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

(ඒ) මෙරට ඉල්ලුම් පත් : 1969.10.31.

(බී) විදේශීය ඉල්ලුම් පත් : 1969.11.7.

**සටහන්—**

(i) මුද්‍රිත ඉල්ලුම් පත් පෝරම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැක. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි වී හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—**

(ඒ) මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවනු ඇත.

(බී) පත්වීම් දෙනු ලබන්නේ අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත්වය.

(සී) තෝරාගනු ලැබූ අයදුම්කරු රජයේ සේවකයෙක් නම් පළමු වෙන්ම පත්වීම දෙනු ලබන්නේ නියමිත කාලයක වැඩ බැලීමේ පදනම මතය.

(ඩී) පළාත් පාලන අමාත්‍යාංශයෙන් ස්ථිර ලේකම් විසින් නියම කරනු ලබන ප්‍රමාණයක ඇපයක් තැබීමට තෝරාගනු ලබන අයදුම්කරුට සිදුවිය හැක.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

(ඒ) වසකට රු. 11,280 දී දෙ වර්ෂයක නැවතීමක් හා වසකට රු. 6,960 හා රු. 11,280 වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව වර්ෂයකට රු. 5,160—360×3—6,240/6,960—360×4 සහ 480×10 වසකට රු. 13,200 දක්වා.

නිලධාරියා ලන්ඩන්හි සිවිල් ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය සඳහා තෝරා ගනු ලැබූ විට ඔහුට ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වසකට රු. 7,320 වැටුප ගෙවනු ඇත.

(බී) තෝරාගනු ලබන අයදුම්කරු, ලන්ඩන්හි සිවිල් ඉංජිනේරු ආයතනයේ සාමාජිකයකු නම්, (එම්.අයි.සී.ඊ) ඔහුට ඉහත කී වැටුප් පරිමාණයේ වසකට රු. 7,320 වැටුප ගෙවනු ඇත.

(සී) (1) ඉංජිනේරුවරුන් (සිවිල්) හට සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් (එනම්, සිවිල් ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය (එම්.අයි.සී.ඊ) නොමැතිව ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වසකට රු. 10,800 අභිබවා යාමට සුදුසුකමක් නොමැත.

(2) වසකට රු. 6,960 වැටුප් ප්‍රියවරට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉම පසු කිරීමට ඉංජිනේරුවරුන් (සිවිල්) දෙපාර්තමේන්තු කාර්ය සංවිධානය, ගිණුම් යනාදිය පිළිබඳ නියමිත පරීක්ෂණයකින් සමත් විය යුතුය. එසේ සමත් වීමට අපොහොසත්වීම වැටුප් වැඩිවීම විලම්බනය කිරීමට හේතු වනු ඇත.

සැ. යු.—සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිතව සේවයට ඇතුලත්වන ඉංජිනේරුවරුන් පත්වීමේ දිනයෙහි සිට අවුරුදු දෙකක් ඇතුලතදී මෙම පරීක්ෂණයෙන් සමත් විය යුතුවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1969.10.31 දින දී වයස අවුරුදු 21 ට නොඅඩු එමෙන්ම අවුරුදු 40 ට නොවැඩි බව (දැනටමත් රජයේ සේවයේ නියුක්තවූවන් හට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

(සී) සිවිල් ඉංජිනේරු විෂයයන් සහිතව ලංකා විශ්ව විද්‍යාලයෙන් ලබාගත් ඉංජිනේරු උපාධියක් හෝ ඒ හා සමාන පිළිගත් උපාධියක් දරන්නකු බව නැතහොත් ලන්ඩන් සිවිල් ඉංජිනේරුවන්ගේ ආයතනයෙහි විභාගයෙහි I හා II කොටස් වලින් හෝ ඒ හා සමාන විභාගයකින් සමර්ථයක් ලබා ඇති බව.

**සැලකිය යුතුය.**—1961 අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනත යටතේ ඉංජිනේරු තනතුරුවලට පත් කරනු ලැබ ඇති ඉංජිනේරුවන්ද මේ තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුස්සෝ වෙත්.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාර ගනු නොලැබේ.)

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුයි.

(ii) ඉල් වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදැදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමඟ තමන්ට එවන ලද ("අ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිත කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝරමය සමඟ තම තමන්ට නිකුත් කරන ලද "අ" සළකුණ දරණ මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බව දැන්වීමක් නොලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියොත් අයදුම්කරුවෙකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ඔක්තෝබර් මස 9 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ. පෙ. 500.

10-669

අංකය : විඅා/2/200.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1970/71 බ්‍රිතාන්‍ය සභා ශිෂ්‍යත්ව

1970 ඔක්තෝබර් මස සිට එක්සත් රාජධානියේ ඉගෙනීම සඳහා බ්‍රිතාන්‍ය සභාව විසින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ශිෂ්‍යත්ව පිරිනැමෙනුයේ පහත සඳහන් විෂයයන්හි අධ්‍යයන සඳහාය.

(අ) විදේශීය භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම—ශිෂ්‍යත් 2

(ආ) ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වැඩිදුර අධ්‍යාපනය—ශිෂ්‍යත්ව 1

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**2. ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් මාස 10 ක් පමණ වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ බ්‍රිතාන්‍ය බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

**3. සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1970.10.1 වැනි දිනට, වයස අවුරුදු 25 හා 35 අතර විය යුතුයි. (පළපුරුද්ද හෝ තත්ත්වය හෝ අනුව විශිෂ්ඨ ලෙස සුදුසු යයි සැලකිය හැකි අයදුම්කරුවන් සම්බන්ධයෙන්, ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශිෂ්‍යත්ව සඳහා පමණක් උපරිම වයස් සීමාව අවුරුදු 45 දක්වා දීර්ඝ කිරීමට ඉඩ ඇත.)

(iii) ඉංග්‍රීසි (කථා කිරීම හා ලිවීම දෙකම) පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුයි.

(iv) (අ) **අයදුම්කරන්නේ ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශිෂ්‍යත්ව** සඳහා නම්—ඉහත (I), (II) හා (II) යටතේ නියමිත සුදුසුකම්වලට අමතරව, පහත සඳහන් ශ්‍රේණීන්ගෙන් එකකට අයත් විය යුතුයි :—

(1) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී හෝ ලන්ඩන්/ලංකා කලා මධ්‍යම විභාගයේදී හෝ ඊට උසස් විභාගයකදී හෝ ඉංග්‍රීසි විෂය යන් සමත් වී ඇත්තාවූද, 1970.10.1 දින වන විට යටත් පිරිසෙයින් අවුරුදු 3ක පාඨමාලා පරීක්ෂක සේවයේ හෝ ගුරුවෘත්තියේ හෝ පළපුරුද්දක් ඇත්තාවූද, ප්‍රධාන අධ්‍යාපන නිලධාරීන්, අධ්‍යාපන උපදේශකයින් හෝ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීන්, හෝ

(2) තුරු විද්‍යාලවල ඉංග්‍රීසි ඉගැන්වීමෙහි නියුක්තව සිටින (අ) විශේෂඥ (ඉංග්‍රීසි) පුහුණු හෝ ද්විතීය (සාමාන්‍ය පාඨමාලා) පුහුණු කථිකාචාර්ය වරුන් සහ අභ්‍යාසාචාර්යවරුන් හෝ (ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී හෝ ලන්ඩන්/ලංකා කලා මධ්‍යම විභාගයේදී හෝ ඊට උසස් වෙනත් විභාගයකදී ඉංග්‍රීසි විෂයයෙන් සමත් උපාධිධර, කථිකාචාර්යවරුන් සහ අභ්‍යාසාචාර්යවරුන්, 1970.10.1 වන විට ගුරු වෘත්තියේ අවුරුදු 3 ක පළපුරුද්දක් ද තිබිය යුතුය.

(ආ) **අයදුම් කරන්නේ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා නම්** ඉහත (I), (II) හා (III) යටතේ නියමිත සුදුසුකම්වලට අමතරව පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ 1 පෙළ හෝ 2 පෙළ (ඉහළ) උපාධියක්.

**සංලක්ෂය 1 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970.10.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) එක්සත් රාජධානියට යාම සහ ආපසු පැමිණීම සඳහා ගමන් පහසුකම්.

(ආ) පෞද්ගලික යැපීම් දීමනාවක්.

(ඉ) පොත් හා උපකරණ සඳහා පවුම් 25 ක දීමනාවක්.

(ඊ) ඉගැන්වීමේ ගාස්තු.

(උ) එක්සත් රාජධානිය තුළ අනුමත කළ ගමන් වියදම්.

**සංලක්ෂය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

**5. සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් ගනාගෙවනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට පමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූ නම් වී සිටිය යුතුය.

**6. ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් එක්සත් රාජධානිය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරී මත් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

**7. වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් එක්සත් රාජධානියේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයකු තෝරාගැනීමෙන් පසු නාමයෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡෙදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්ද මකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1969.10.31 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතන වල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් නොලද හොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිති වාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 ඔක්තෝබර් මස 9 වැනිදා,
කොළඹ 2, මැල් වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

10-674

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වැඩ පරීක්ෂක තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයෙ වැඩ පරීක්‍ෂක තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප.**—මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය මෙසේ ය :—

2. **වැටුප.**—මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය මෙසේ ය : වර්‍ෂයකට රුපියල් 1,860—120—රු. 3.780 (කාර්යක්ෂමතා කඩඉම රුපියල් 2,820 ට පෙර) රුපියල් 3,900—180—රු. 5,340.

3. **සේවා කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. අවුරුදු තුනක ආධුනික කාල සීමාවකට යටත් වේ.

(ii) තෝරාගත් අපේක්ෂකයා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේව යෙහි නියුක්ත විය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානයා නියම කරන ආකාරයකට මුදලින් ඇප තැබීමට ද යටත් විය හැකිය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1969.11.1 දිනට වයස අවුරුදු 25 කට අඩු නොවිය යුතු අතර අවුරුදු 35කට වැඩි නොවිය යුතු බව (රාජ්‍ය සේවාවේ නියුක්ත නිලධාරීන් කෙරෙහි මෙම උපරිම වයස සීමාව අදාල නොවේ) :

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවට.

(ඇ) අවුරුදු 5 ක සිවිල් ඉංජිනේරු ආධුනිකත්වය සම්පූර්ණ කර තිබෙන අතර iv (අ) පරිශිෂ්ටයෙහි නියමිත ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ උප පරීක්ෂක ශ්‍රේණියට උසස් වීමට සුසුදුකම් ලැබීමේ දෙපාර්තමේන්තු විභාගයෙන් සමත්ව සිටින බවට : හෝ

(ii) සැලසුම්කරුවෙකු හෝ ඕවර්සියර් කෙනෙකු වශයෙන් අවුරුදු 5 ක ප්‍රායෝගික පළපුරුද්දක් ඇති අතර (iv) (අ) පරිශිෂ්ටයෙහි නියමිත ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ උප පරීක්‍ෂක ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලැබීමේ දෙපාර්තමේන්තු විභාගයෙන් සමත්ව සිටින බවට : හෝ

(iii) කාර්මික විද්‍යාලයේ අවුරුදු 4 කට නොඅඩු සිවිල් ඉංජිනේරු පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති බවට : හෝ

(iv) මිණුම් හා මට්ටම් කිරීම පිළිබඳ සර්වේ ජනරාල්ගේ බල පත්‍රය ලබා සිටින අතර ජල සැපයීම, ගොඩනැගිලි ගොඩනැංවීම් වැනි ගොඩනැගිලි වැඩ පිළිබඳ දැවුරුද් දක පළපුරුද්දක් ඇති බවට : හෝ

(v) සිවිල් හෝ යාන්ත්‍රික ඉංජිනේරු ආධුනිකත්වය සම්පූර්ණකොට තිබෙන අතර පස් අවුරුද්දකට නොඅඩු (එකතු වූ විට) ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බවට. මීට අමතර වශයෙන් මෙම කරුණු ද්වයෙහි ලා ඉදි කිරීම් හෝ විශාල ගොඩනැගිලි වැඩ සහ මිණුම් මට්ටම් කිරීම පිළිබඳ න්‍යායානුකූල දැනීමක් හා ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බවට :

සැ. යු.—(මෙම සුදුසුකම් ඇති අපේක්ෂකයන්ට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටීමට සිදු විය හැකි අතර පත්වීම ලැබ අවුරුදු දෙකක් තුලදී iv (අ) පරිශිෂ්ටයෙහි නියමිත ප්‍රසිද්ධ වැඩ දෙපාර්ත මේන්තුවේ උප පරීක්ෂක ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලැබීමේ විභාගයෙන් ද සමත් විය යුතුය) : හෝ

(vi) යටත් පිරිසෙයින් කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටින අතර පාරවල් තැනීම හා ගොඩනැගිලි වැඩ පිළිබඳ හෝ ජල සැපයීම් පිළිබඳව අඩුම වශයෙන් 7 අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බවට. මිණුම් හා මට්ටම් කිරීම පිළිබඳ මනා දැනීමක් ද තිබිය යුතුය.

සැ. යු.—(මෙම සුදුසුකම් ඇති අපේක්ෂකයින් හට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවිය හැකි අතර පත්වීම ලැබ අවුරුදු දෙකක් තුලදී iv (අ) පරිශිෂ්ටයෙහි නියමිත ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ උප පරීක්ෂක ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලැබීමේ විභාගයෙන් ද සමත් විය යුතුය.)

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම්පත් වලට පහත සඳහන් සහතික වල පිටපත් අමුනා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.

(ii) උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iii) මෑතදී ලබාගත් චරිත සහතික තුනක්.

(iv) කාර්මික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික.

6. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුරූප වන සේ පිළියෙල කළ අයදුම්පත් 1969 නොවැම්බර් මස 10 වැනි දිනට හෝ ඊට පෙර පේරාදෙණියේ, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) ට ලැබෙන සේ එවිය යුතුය. එම අයදුම්පත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) ගේ නමින් අමතා ඉදිරිපත් නොකළ යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි (II) වැනි ඡේදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධ යෙහිලා අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

ලො. බ. මාරඹේ,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන).

1969 ඔක්තෝබර් 7 වැනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

### වැඩ පරීක්ෂක තනතුර සඳහා ආදර්ශ ඉල්ලුම්පත්‍රය

**වැඩ පරීක්ෂක තනතුර සඳහා ආදර්ශ ඉල්ලුම්පත්‍රය**

1. නම :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.

4. උපන් දිනය හා 1969.11.1 වැනි දිනට වයස :————.

5. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය හා දිනය :————.

6. උසස්ම අධ්‍යාපන සුදුසුකම් :————.

7. කාර්මික සුදුසුකම් :————.

8. පළපුරුද්ද :————.

9. අමුණා ඇති චරිත සහතික පත්‍ර නිකුත් කළ තිදෙනෙකුගේ නම් :————.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-661

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බීජ කාර්මික තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ කාර්මික තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1969 නොවැම්බර් 7 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පේරාදෙණියේ, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ (පරිපාලන) වෙත එවිය යුතුයි.

**වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 750—42—රු. 1,086කි.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අපේක්‍ෂකයින් විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්‍ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර ශක්තියෙන් යුක්ත බව.

(ආ) 1969. 10. 1 දිනට වයස අවුරුදු 20ට නොඅඩු හා 30ට නොවැඩි බව. (රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ, සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව, අංක ගණිතය හෝ ගණිතය සහ වෙනත් විෂයයන් හතරකින් සාමාර්ථය ලබා ඉන් විෂයයන් පහක් එකම විභාගයේදී එකම වර සමත්වී ඇති අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) සහ ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලා සහතිකය ; හෝ

(11) බීජ විග්‍රහ කිරීමේ කටයුතු පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු 3ක වත් පළපුරුද්දක් ඇත්තාවූද ස්ථිර පත්වීම් ඇති ඇති දෙපාර්තමේන්තුවේ වෙනත් සේවකයින්.

5. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකපත්‍රවල පිටප් එවිය යුතුයි. (මුල් පිටපත් නොවේ).

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ආ) ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලා සහතිකය.

(ඇ) උප්පැන්න සහතිකය.

(ඈ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික තුනක්.

6. මේ ගැසට් පත්‍රයේ පළමුවන කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

7. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ඉල්ලුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

8. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනික් ලියකියවිලි සියල්ලක්ම පේරාදෙනියේ, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ (පරිපාලන) ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

එම්. එස්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය,
69. 10. 7.

### ආදර්ශ ඉල්ලුම්පත්‍රය

#### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ කාර්මික තනතුරු

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නාමය :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා 1969. 10. 1 දිනට වයස :————.
4. ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන්ද යලිපදිංචි කිරීමෙන්ද : ————.
5. උසස්ම අධ්‍යාපන සුදුසුකම් :————.
6. වෘත්තීය සුදුසුකම් :————.
7. පළපුරුද්ද :————.
8. චරිත සහතික ලබාගත් අයගේ නම් :————.

මේ අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගැනීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසුව අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන.
————,

දිනය :————.

10–657

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ගබඩා භාරකරු තනතුරු (ගොවිපලවල් සහ ව්‍යාප්ති මධ්‍යස්ථාන)**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකාර තනතුරු (ගොවිපල වල් හා ව්‍යාප්ති මධ්‍යස්ථාන) සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය වර්ෂය කට රු. 888—72—රු. 2,184 ක් වේ. වර්ෂයකට රු. 1,608 ඉක්මවීමට පෙර කාර්යක්‍ෂමතා කඩඉමෙන් සමත් විය යුතුය.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත්වේ.

4. සෑම අපේක්‍ෂකයෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්‍ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය, හෝ

(ii) දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(iii) ඊට සමාන විභාගයකින් සමත්ව සිටීම,

සහ

පිළිගත් ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක අඩු වශයෙන් තුන් අවුරුද්දක ගබඩා භාරකාර පළ පුරුද්දක් තිබිය යුතුය. අවුරුදු පතා අවශ්‍ය වන භාණ්ඩ වර්ග ඇස්තමේන්තු කිරීම, අගය තක්සේරු කිරීම, භාණ්ඩ ඉල්ලුම් පත්‍ර සකස් කිරීම හා කාර්යාලීය වැඩ පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකම් වශයෙන් ගැනේ.

හෝ

(iv) රජයේ දෙපාර්තමේන්තුවක අවුරුදු 5 ක තාවකාලික ගබඩා භාරකාර සේවයේ පළපුරුද්දක් සහිත කණිෂ්ඨ පාඨශාලා විභාගයෙන් සමත්වී සිටීම.

(ආ) (i) 69.10.1 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු බවටත්, අවුරුදු 35 ට නොවැඩි බවටත්, (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත වීම.

5. සියලුම ඉල්ලුම් පත්‍රවල පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය (සැලකිය යුතුයි.—බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ නීති සංග්‍රහය අනුව නිකුත් කළ උප්පැන්න සහතික පත්‍රය පිළිගනු නොලැබේ.)

(ii) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පිළිබඳ උසස්ම සහතික පත්‍ර වල පිටපත්.

6. මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල කොන්දේසි ද කියවා බලන්න.

7. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර 1969 නොවැම්බර් 10 වැනි දින හෝ ඊට පෙර පේරාදෙනියේ නියෝජ්‍ය කෘෂිකමර් අධ්‍යක්‍ෂ (පරිපාලන) වෙත ලැබෙන ලෙස ඉල්ලුම්කරුගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් එවිය යුතුය. මොනම කරුණක් නිසා හෝ කෘෂිකර්ම අධ්‍යක්‍ෂගේ පුද්ගලික නමට ඉල්ලුම් පත් එවිය යුතු නොවේ. මේ සඳහා විශේෂ ආකෘති පත්‍ර සපයනු නොලැබේ.

ඇම්. ඇස්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

1969. 10 මස 7 වැනි දා,
පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—පේරාදෙණිය**

**ශබ්ධ භාරකාර තනතුරු (ගොවිපල හා ව්‍යාප්ති මධ්‍යස්ථාන) සඳහා ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය**

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා වයස :————.

4. උපන් ස්ථානය :————.

(අ) අයදුම්කරුගේ :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ පියාගේ :————.

(ඈ) අයදුම්කරු ලංකාවේ උපත ලබා සිටි නම්, (අ) වගන්තිය ඇතුළු (ආ) වගන්තිය හෝ (ඇ), (ඈ) වගන්ති දෙකද පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ උපත නොලැබුනේ නම් (අ) වගන්තිය ඇතුළු (ආ) සහ (ඇ) වගන්තිය හෝ (ඇ), (ඈ) පිරවිය යුතුය.

5. අයදුම්කරු ලියාපදිංචිවීමෙන් හෝ පරම්පරාවෙන් ලංකාවේ පුර වැසි භාවය ලබා සිටීද ? :————.

6. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :————.

7. අවුරුදු පතා අවශ්‍ය භාණ්ඩ වර්ග ඇස්තමේන්තු කිරීම හා අගය තක්සේරු කිරීමේ, භාණ්ඩ ඉල්ලුම් සකස් කිරීම හා කර්යාලීය වැඩ පිළිබඳ පළපුරුද්ද :————.

8. දැනට කරන රක්ෂාව :————.

9. කලින් කළ රක්ෂාවල් හා ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

මගේ අංකය :

කෘෂිකර්ම අධ්‍යක්ෂ මෙතුමනි,

(දෙපාතර්මේන්තු ප්‍රධානියාගේ නිර්දේශය)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

10-698

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කෘෂිකර්ම විද්‍යා පරීක්ෂණ නිලධාරි තනතුරු**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ II වැනි පන්තියේ කෘෂිකර්ම විද්‍යා පරීක්ෂණ නිලධාරි තනතුරු සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට යටත් වේ. දෙපාතී මේන්තුවේ ස්ථිර සේවකයෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලසීමාවක් තුළදී වැඩ බැලීමට පත් කරනු ලැබේ.

(iii) තෝරාගත් අපේක්ෂකයින් දිවයිනේ නියම කැරෙන කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය.

3. **වැටුප් සහ දීමනා.—** මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය :—

2 වැනි පන්තිය—වර්ෂයකට රු. 2,820—120×9 සහ 180×4 රු. 4,620 දක්වා වැඩිවී යයි (රු. 3,420ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.)

4. **අවශ්‍ය සුදුසුකම්.—** සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධිධරයෙකු විය යුතුය.

(ඇ) 1969 ඔක්තෝබර් මස 31 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නත).

**සටහන.—** ලංකා විශ්ව විද්‍යාලයයේ කෘෂිකර්මය පිළිබඳ උපාධි අවසාන පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගෙන්ද අයදුම්පත් භාරගනු ලැබේ. එහෙත් ඔවුන් සම්බන්ධයෙන් සලකා බලනු ලබන්නේ ප්‍රතිඵල නිකුත් වී සතියක් ඇතුළත ඔවුන්ගේ සාමාර්ථයන් සම්බන්ධයෙන් දැනුම් දුනහොත් පමණි.

5. සෑම අයදුම්කරුවෙක්ම තම අයදුම්පතට පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික පත්‍රයේ පිටපත.

(ඇ) මෑතදී ලබාගත් චරිත සහතිකපත් දෙපක් පිටපත් (සැ. යු.—මෙම සහතික පත්වල මුල් පිටපත් අමුණා නොඑවිය යුතුයි).

6. පහත සඳහන් ආකෘතිපත්‍රයට අනුකූල වනසේ පිළියෙල කරන ලද අයදුම්පත් 1969 ඔක්තෝබර් මස 31 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පේරාදෙනියේ, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් හෝ ඊට අදාල සෙසු සෑම ලියකියවිල්ලක්ම එවිය යුත්තේ පේරාදෙණියේ, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙතය. මගේ හෝ දෙපාර්තමේන්තු කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයදුම්පත් හා ලියකියවිලි නොඑවිය යුතුය.

8. අයදුම්පත් ලැබුණ බව දන්වනු ලැබේ. මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ (11) වැනි ඡේදයේ මුල් පිටුවේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි කෙරෙහි ද අවධානය යොමු කරවනු ලැබේ.

එම්. එස්. පෙරේරා.
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1969 ඔක්තෝබර් 4 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

### අයදුම්පත් ආකෘති පත්‍රය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ II වැනි පංතියේ කෘෂිකර්ම විද්‍යා පරීක්ෂණ නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය**

1. (අ) සම්පූර්ණ නම:————.

නම :————.

වාසගම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. 1969 ඔක්තෝබර් මස 31 වැනි දිනට වයස සහ උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

4. පියාගේ නම සහ රක්ෂාව :————.

5. උපන් ස්ථානය :————.

(අ) ඉල්ලුම්කරුගේ පියා :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. (අ) ජාතිය :————.

(ආ) ඔබ ලාංකිකයෙක් ද :————.

(i) උප්පත්තියෙන් ද :————.

(ii) නැතහොත් ලියා පදිංචි කරවා ගැනීමෙන් ද :————.

7. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

8. වෙනත් විස්තර :————.

ම විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙම අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනහොත් කිසිම වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බවත්, මම දැන සිටිමි.

................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-540

## ලංකා යුධ හමුදාව

### සාමාන්‍ය (ආධුනික) සෙබළුන් බඳවා ගැනීම

ලංකා යුධ හමුදාවේ නිත්‍ය හට සේනාවේ සාමාන්‍ය (ආධුනික) සෙබලුන් බඳවා ගැනීම පිණිස පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම් කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. **සාමාන්‍ය හා විශේෂ කොන්දේසි :—**

අයදුම්කරුවකු :—

(අ) ලාංකිකයකු විය යුතුයි. "ලාංකික" යනුවෙන් අදහස් කරනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් හෝ ලංකාවේ පුරවැසියකු වූ කෙනෙකි.

(ආ) යටත් පිරිසෙයින් සිංහල දෙමළ හෝ ඉංග්‍රීසි පස්වන පන්තිය සමත්ව සිටිය යුතුයි. (කනිෂ්ඨ පන්තිය/8 වන ශ්‍රේණිය හෝ උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අයට විශේෂත්වයක් දක්වනු ලැබේ.)

(ඇ) රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනත්වය පැහැදිලිවම සඳහන් කළ යුතු අතර සනාථ කළ යුතුය.

(ඈ) උස අඩි 5 යි අඟල් 4 ට අඩු නොවිය යුතුයි. (උස අඩි 5 යි අඟල් 6 ට වැඩි අය කෙරෙහි විශේෂත්වයක් දක්වනු ලැබේ.)

(ඉ) 1969 නොවැම්බර් මස 7 වන දිනට අවුරුදු 18 ට නොඅඩුවද, 22 ට නොවැඩිවද සිටිය යුතුයි.

(ඊ) යුධ හමුදා ආඥාපති තුමාගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීය යුතුය.

3. (අ) (ඈ) යන උපඡේදයන්හි දැක්වෙන අධ්‍යාපනික හා ශාරීරික සුදුසුකම්, අඩුම වශයෙන් ගැනෙන අවශ්‍යතාවයන් බව සැලකිය යුතුය. ඉහත සඳහන් 2 වන ඡේදයේ දැක්වෙන අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් නිත්‍ය හට සේනාවට බඳවා ගැනීම පිණිස සලකා බලනු නොලැබේ.

4. **සේවා කාලය.**—අවුරුදු 12 සේවය සඳහා බඳවා ගනු ලබන සෙබලකු, මුල් අවුරුදු 5 නිත්‍යබල සේනාවේද ඉතිරි අවුරුදු 7 නිත්‍ය උපසේවා බල හමුදාවේද සේවය කිරීමෙන් පසු අස්කිරීමට ඉඩ තිබේ. සමහර අවස්ථාවලදී සෙබලකුගේ නිත්‍ය බලසේනා සේවය අවුරුදු 12 දක්වා දීර්ඝකර ගැනීමටත්, අවුරුදු 32 දක්වා කාලයක් එසේ සේවය කිරීමටත් ඉඩ සලසනු ලැබේ.

5. වැටුප් හා දීමනා :—

(අ) යුධ හමුදා හට සේනාවේ සෙසු නිළ දරණ සෙබලුන් සඳහා වූ වැටුප් හා දීමනා 1961 අප්‍රේල් මස 28 දින අංක12,395 දරණ රාජ්‍ය නිවේදන පත්‍රයේ පළවූ 1961 යුධ හමුදා වැටුප් සංග්‍රහයේ (1) වන කොටසට අනුකූලව වනු ඇත.

(ආ) වැටුප.—1961 යුධ හමුදා වැටුප් සංග්‍රහයට අනුකූල වෘත්තියක් නොමැති සාමාන්‍ය සෙබලාගේ සිට වෘත්තියක් නොමැති බලලත් නිළධාරි 1 දක්වා ගෙවනු ලබන මාසික මාසික වැටුප පහත සඳහන් වේ.

| **නිළය** | | | **මාසික වැටුප** රු. ශත |
|---|---|---|---|
| සාමාන්‍ය සෙබළ | ... | ... | 70 00 |
| ලාන්ස් කෝප්‍රල් | ... | ... | 85 00 |
| කෝප්‍රල් | ... | ... | 115 00 |
| සැරයන් | ... | ... | 180 00 |
| භාණ්ඩලීක සැරයන් | ... | ... | 202 50 |
| බලලත් නිළධාරි II | ... | ... | 220 00 |
| රෙජිමේන්තු උපකරන පාලක සැරයන් | | ... | 235 00 |
| බලලත් නිළධාරි I | ... | ... | 250 00 |

(ඇ) **ජීවනාධාර හා විශේෂ ජීවනාධාර.**—රජයේ ගෙවීම් ක්‍රමයටම ජීවනාධාර හා විශේෂ ජීවනාධාර මුදල පහත සඳහන් වගී වලට අයත් සෙබලුනට ගෙවනු ලැබේ.

(i) හමුදා වියදමෙන් ආහාර නොසැපයෙන විවාහක සෙබළා,
(ii) හමුදා නිවාස වලින් බැහැරව විසීමට අවසර ලත් අවිවාහක සෙබළා හා
(iii) හමුදා නේවාසිකාගාරයෙන් ආහාර නොගෙන නිවාඩු ලබා සිටින අවිවාහක සෙබළා.

(ඈ) **හමුදා වියදමෙන් ආහාර සපයනු ලබන විවාහක හෝ අවිවාහක සෙබලකුට හිමිවනුයේ :—**

(i) රජයේ ගෙවීම් ක්‍රමයට අනුකූල වූ ජීවනාධාර මුදලේ හා විශේෂ ජීවනාධාර එකතුව හා
(ii) යුධ හමුදා ආඥාපති විසින් නිගමනය කරනු ලබන ආහාර සැපයීම පිණිස වූ වියදම අතර වෙනසය.

(ඉ) **ගෙවල් කුලී.**—සේවා හෝ රජයේ නිවාසවල නොවෙසෙන විවාහක සෙබලුන්ට හා නේවාසිකාගාරවල ඉඩ පහසුකම් නොමැති හෝ රජයේ නිළධාරීන් සඳහා වූ දීමනා හා කොන්දේසි අනුව ඔවුන්ගේ පත්වීම් සඳහා දෙනු ලබන විශේෂ නිවාස නොමැති අවිවාහ සෙබලාට ගෙවල් කුලී ගෙවනු ලැබේ. විවාහකයන් සඳහා වූ රජයේ හෝ සේවා නිවාසවල වෙසෙන සෙබලකු ගෙවල් කුලී දීමනාවට අහිමි වනු ඇත.

(ඊ) **නිළ ඇඳුම් සේදීම හා දීමනා :—**

(i) නේවාසිකාගාරයේ වෙසෙන සෙබලකුගේ නිළ ඇඳුම් හමුදා වියදමෙන් සෝදා දෙනු ලැබේ.

(ii) හමුදා නේවාසිකාගාරයෙන් බැහැරව වෙසෙන සෙබලෙකු, ඔහුගේ නිළ ඇඳුම් සේදීම පිණිස යුධ හමුදා ආඥාපති විසින් නිගමනය කරනු ලබන දීමනාවකට හිමිකරුවකු වනු ඇත.

(උ) **සේවා වැඩිවීම්.**—සෑම සෙසු නිළ දරන්නෙකුටම සේවා වැඩිවීම් වශයෙන් සෑම ගනන් ගැනෙන 5 අවුරුදු සේවා කාලයට මසකට රු. 4.50 බැගින් ගෙවනු ලැබේ.

(ඌ) **නිළ වැඩිවීම්.**—කෝප්‍රල් සිට බලලත් නිළධාරි II දක්වා නිළ වැඩිවීම් වශයෙන් එම නිළයේ සෑම 4 අවුරුදු සේවා කාලයකටම මසකට රු. 7.50 බැගින්ද, බලලත් නිළධාරි I දරණ අයෙකුට 4 අවුරුදු සේවා කාලයට රු. 15.00 බැගින්ද ලැබෙනු ඇත. කෝප්‍රල් හෝ සමාන නිළයක් දරන්නෙකුට හිමිවනුයේ නිළ වැඩිවීම් 4 ක් පමණකි.

(එ) **"වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදල" :—**සන්නධ සේවා වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල් වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩුකර ගැනීම ගැන තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් යුධ හමුදාවට බැඳීමේදී සෑම සෙබලකු විසින්ම දිය යුත්තේ ය.

6. ඉහත සඳහන් (1) වන ඡේදයෙහි දැක්වෙන ඇබෑර්තු සඳහා එවන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් නීතිවලට අනුකූල විය යුතුය.

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය අන්තයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ අනුසාරයෙන් අයදුම් කරුගේ අත් අකුරින්ම පිළියෙල කර පුරවන ලද ඒවා විය යුතුය.

(ආ) ලංකා ස්වේච්ඡා හට හමුදාවේ සේවයේ නියුක්ත වූ අයගේ ඉල්ලුම් පත් ඒ ඒ රෙජමේන්තු මූලස්ථාන මාර්ගයෙන් එවිය යුතුය.

(ඇ) ඉල්ලුම් පත් 1969 දෙසැම්බර් මස 15 වෙනි දින පස්වරු 1 ට පෙර "යුධ හමුදා ආධුනිකයින් බඳවන නිළධාරි" යුධ හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයේද එය බහාලනු කවරය මතු පිටද "ඉල්ලුම් පත්‍රය නිත්‍ය හට සේනා ආධුනික" යන්න සඳහන් කළ යුතුය.

(ඈ) ඉල්ලුම් පත්‍රය සමග පහත සඳහන් සහතිකවල **පිටපත් පමණක්** එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියාපදිංචි කර නොමැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශ්ෂ සහතිකය. බෞතීස්ම සහතික, ආධාර ලබන පාසැල්වල රෙගුලාසි සංග්‍රහය යටතේ භාවිත යට පමණක් නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ ජන්ම පත්‍ර භාරගනු නොලැබේ.

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(iii) අයදුම්කරුගේ චරිතය සහ මෙම තනතුර පිළිබඳ යෝග්‍යතාවය ගැන මෑතදී ලබාගත් සහතික තුනක්. රක්ෂාවක යෙදී සිටින්නේ නම් මින් එක් සහතිකයක් තමාගේ වර්තමාන ස්වාමියාගෙන් විය යුතුය.

(iv) ක්‍රීඩා ශිෂ්‍ය හට පුහුණුව ආදිය පිළිබඳ සහතික පත්‍ර, **සැලකිය යුතුය.**—මෙම සහතිකවල මුල් පිටපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවූව හොත් පමණකි. ඉල්ලුම් පත් සමග සහතික පත්වල මුල් පිටපත් එවනු ලැබ ඒවා නැතිවුවහොත් ඊට යුධ හමුදා මූලස්ථානය වග කියනු නොලැබේ.

(ඉ) තැපෑලේදී නැතිවුන, ප්‍රමාදවුන ඉල්ලුම් පත්‍රයක් හෝ ඊට අදාල ලිපියක් පිළිබඳව කෙරෙන චෝදනාවක් ගැන සළකා බලනු නොලැබේ.

(ඊ) රජයේ සේවයේ යෙදී සිටින අය විසින් එවන ලබලු ඉල්ලුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාගීයෙන් එවිය යුතුය.

(උ) දෙපාතීමේන්තු ප්‍රධානියාගේ මාගීයෙන් එවනු ලැබ, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ඉල්ලුම් පත්‍ර, භාර ගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තු වලට ලැබ යථෝක්ත දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ප්‍රමාදය පිළිබඳ පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් නොකරන ලද ඉල්ලුම් පත්‍ර භාර ගනු නොලැබේ.

(ඌ) සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුයයි තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන්, තේරීම් මණ්ඩලය මගින් පවත්වන ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා තමාගේම වියදමෙන් පැමිණ පෙනී සිටිය යුතුය. එම ඉල්ලුම් කරුවනට සම්මුඛ පරීක්ෂණය පවත්වන ස්ථානය, දිනය හා වේලාව පුද්ගලිකව දන්වනු ලැබේ.

(එ) තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්‍ෂණයෙන් බඳවා ගැනීමට සුදුසුයයි තෝරා ගන්නා ලද ඉල්ලුම් කරුවන්, වෛද්‍ය පරීක්‍ෂණ එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා තමාගේ වියදමෙන් කොළඹ දී පෙනී සිටිය යුතුය.

(ඒ) සම්මුඛ පරීක්‍ෂණයෙන් සහ යුධ හමුදා තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන අවශ්‍ය අනිකුත් පරීක්‍ෂණ වලින්ද පසුව සාමාන්‍ය සෙබල හෝ සමාන නිළයකට යුධ හමුදා නිත්‍ය හට සේනාවට බඳවා ගන්නා අතර යුධ හමුදා අභ්‍යාස මධ්‍යස්ථානයේ හෝ අන් තැනක පවත්වනු ලබන පුහුණුවීමේ අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීමට සලසනු ලැබේ.

(ඔ) වයස අවුරුදු 21 අඩු අය තමාගේ දෙමාපියන්ගෙන් හෝ භාරකාරයාගෙන් කැමැත්ත පළකොට ලියවිල්ලකින් ලබා ගෙන නොමැති නම් නිත්‍ය හට සේනාවට බඳවා ගනු නොලැබේ.

(ඕ) තෝරා පත් කර ගත් සෑම ඉල්ලුම් කරුවෙක්ම ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව ක්‍රියා කළ යුතුය.

(ක) ඉල්ලුම්කරු රෙකමදාරු කිරීමට කැමති කෙනෙකු වේ නම් ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය හැකිය. ඉල්ලුම් කරුවෙකුගේ තෝරාගැනීම පිළිබඳව දරන අයථා ප්‍රයත්නයක් වේ නම් ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සෙකු වීමට ඉඩ තිබේ.

(ග) යම් ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුනි නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසුව අනාවරනය වුනි නම් විනයානුකූලව ක්‍රියා කිරීමටත් සහ රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

බ්‍රිගේඩියර්, එම්. ඒ. ජයවීර,
ප්‍රධාන මාණ්ඩලික,
යුද හමුදාධිපති වෙනුවට.

යුධ හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ.
1969 ඔක්තෝම්බර් මස 9 දින.

නිත්‍ය හට සේනාවේ සාමාන්‍ය (ආධුනික) සෙබලකු වශයෙන් බැඳීම පිණිසවූ ආදර්ශ ආකෘති පත්‍රය

(1) නම සම්පූර්ණයෙන් (පැහැදිලි අකුරින්) :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය :————. වයස :————.

(4) (අධ්‍යාපනික) සමත් වූ විභාග දින සහිතව විෂයයන් සඳහන් කළ යුතුය :————.

(5) උස :— අඩි :——, අඟල් :——.

(6) ඔබ ලංකා පුරවැසියෙක්ද ? :————.

(7) විවාහකද අවිවාහකද සඳහන් කළ යුතුය :————.

(8) පාසැලෙන් අස්වූවාට පසුව යෙදී සිටින ලක්‍ෂාව :————.

(9) මීට ප්‍රථම යුධ, නාවුක, ගුවන් හා ස්වේච්ඡා සේවක හමුදාවල දැරූ තනතුරු, තත්ත්වය දින ඇතුළුව සම්පූර්ණ විස්තර : ————.

(10 වෙනත් සුදුසුකම් (ක්‍රීඩා ආදිය) :————.

(11) ඉතා කිට්ටු තැපැල්/විදුලි පණිවුඩ කායභීලය :————.

(12) ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

(13) ඉදිරිපත් කරන ලද චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරු :—

(1) :————.

(2) :————.

(3) :————.

(14) කොළඹ හේවා ආරෝග්‍යශාලාවේ දී පවත්වන ලද වෛද්‍ය පරීක්‍ෂණයකින් අසමත්වීම නිසා ඔබ යුධ හමුදාවට, හෝ ගුවන් හමුදාවට බඳවා ගැනීම ප්‍රතික්ෂේප කොට තිබේද ? :————.

(15) ඉල්ලුම්කරු විසින් අත්සනින් කර සිටින ප්‍රකාශය :—

ඉහත සඳහන් ප්‍රශ්නවලට මා විසින් සපයන ලද පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බවට මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–676—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## පුස්තකාල සහකාර තනතුර

බැංකුවේ V ශ්‍රේණියේ පුස්තකාල සහකාර තනතුරක් සඳහා අයැදුම් පත් කැඳවේ. අයැදුම් පත්, කොළඹ 2—යුනියන් පෙදෙසේ, මාටිනස් සී. පෙරේරා ගොඩනැගිල්ලේ අංක 167 1/1 හි මහජන බැංකුවේ සේවක කළමනාකාර තැනගෙන් ලබා ගත යුතු මුද්‍රිත ආකෘතියන්හි වියයුතු අතර 1969.10.31 දින නොහොත් ඊට පෙර සේවක කළමනාකාර තැන වෙත ලැබිය යුතුය.

(අ) වැටුප සහ දීමනා

(i) වැටුප් පරිමාණය: රු. 242 සිට රු. 435—10×10, 2×12, 1×14, 5×15.

(ii) රජයේ පරිමාවන් අනුව ජීවන වියදම් සහ විශේෂ ජීවනාධාර දීමනා.

(iii) රු. 25 ක අන්තර දීමනාවක්.

(ආ) සුදුසුකම්

(i) වයස—අයැදුම් කරුවන් 1969 ඔක්තෝබර් මස 31 දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුය.

(ii) ජාතිය—අයැදුම් කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසියන් වියයුතු ය.

(iii) අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්—

(අ) එකම වතාවකදී යටත් පිරිසෙයින් විෂයයන් හයකින් පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගය හෝ සමත් විම. අයැදුම්කරුවන් පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේදී නැතහොත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයේදී නැතහොත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයේදී හෝ ඊට උසස් විභාගයකදී හෝ සිංහල සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාර්ථ ලබා තිබිය යුතුය.

(ආ) ලංකා පුස්තකාල සංගමයේ හෝ එංගලන්තයේ පුස්තකාල සංගමයේ හෝ මූලික පරීක්‍ෂණය සමත්ව තිබිය යුතුය.

(ඇ) පුස්තකාලීය කටයුතු සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 2 ක සේවා පළපුරුද්ද.

(ඈ) ඉංග්‍රීසියෙන් සහ සිංහලයෙන් යතුරු ලියනය කිරීමට හැකියාවක් සහ ලඝුලේඛනය පිළිබඳ දැනුමක් තිබීම අමතර සුදුසුකමක් වේ.

([illegible]) අයැදුම් කරුවන්, අයැදුම් පතට මෙම සහතිකයන් හි පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය.

(i) උප්පැන්න සහතිකය

සටහන.—පාඨශාලීය නොහොත් අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කැරෙන විශේෂ උප්පැන්න සහතිකය භාරගනු නො ලැබේ.

(ii) අධ්‍යාපනික සුදුසුකම් සහතිකය

සටහන.—(අ) විභාග කොමසාරිස් තැන විසින් නිකුත් කැරුණු සහතික පත් ඇති කල එම සහතිකයන් හි පිටපත් ඇමිණිය යුතුය.

(ආ) විභාග කොමසාරිස් තැන විසින් නිකුත් කැරුණු සහතික පත් නොමැති කල, අයදුම් කරු ගේ විභාගාංක, විභාගයන් පැවැත්වුණු දිනයන්, සමත්වූ විෂයයන් සහ ඒ ඒ විෂයයෙන් ලබාගත් ශ්‍රේණී දැක්වෙන, විදුහල්පති වරුන් විසින් නිකුත් කැරුණු සහතික වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(iii) අයැදුම් කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ යෝග්‍යතාවය සම්බන්ධයෙන් මෑතකදී ලබාගත් සහතික තුනක්.

(ඇ) **සේවා කොන්දේසි.**—තෝරා ගැණුනු අපේක්ෂකයා විසින්,

(i) පත්වීම් ලබාගැනීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීම.

(ii) අවුරුද්දක ශිඅාධුනික කාලයකට යටත්ව සේවය කොට, සේවයෙහි ස්ථිර කරනු ලැබීමට පෙර ලංකා පුස්තකාල සංගමයේ හෝ එංගලන්තයේ පුස්තකාල සංගමයේ හෝ මධ්‍ය පරීක්ෂණය සමත් වීම.

(iii) බැංකුවේ සේවාවසාන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකට බැඳීම.

(iv) දිවයිනෙහි ඕනෑම පළාතක සේවය කිරීම අවශ්‍යවේ.

(ඉ) **ඇපය.**—තෝරා ගැණුනු අපේක්ෂකයා විසින් මුදලින් රු. 500 ක ඇපයක් තැන්පත් කළයුතු වේ.

**පොදු.**—කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අපේක්ෂකයන්ගෙන් අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අන් කිසිදු වියදමක් හෝ බැංකුව මගින් ගෙවනු නොලැබේ.

තම අයැදුම් පත් ලේඛනගත තැපැලෙන් එවන මෙන් අපේක්ෂක සිනට උපදෙස් දෙමු. තම අයැදුම් පත් අප වෙත ලත් බැව් දැනුම් දෙනු ලැබීමට පිසි අයැදුම් කරුවන් තම අයැදුම් පත් සමග ලිපිනය ලියු මුද්දර ගැසූ ලිපි කවරයක් එවිය යුතුය.

අයැදුම් පත් "v ශ්‍රේණියේ පුස්තකාල සහකාර තනතුර සඳහා අයැදුම්පත" යනුවෙන් ලිපි කවරයෙහි වම් උඩු කෙළවරෙහි පැහැදිලිව සටහන් කළයුතු ය.

සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවෙනුයේ තනතුර සඳහා මැනැවින් ම සුදුසුකම් ලබා ඇති අයැදුම් කරුවන් පමණි.

සේවක කළමනාකාරතැන.

මහජන බැංකුව,
යුනියන් පෙදෙස,
කොළඹ 2,
1969 ඔක්තෝබර් මස 7.

10-641—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය

### ප්ලාස්ටික් නිෂ්පාදනයෙහි පුහුණුව සඳහා ශිෂ්‍යත්ව

ෆේඩරල් ජර්මන් ජනරජයේ පුහුණුව සඳහා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනයේ නියුක්ත අනුමත කරන ලද හෝ ලියා පදිංචි කරන ලද කර්මාන්ත එක්කයන්ගෙන් (කර්මාන්ත ආයතන වලින්) ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන ආකෘතියේ ආකාරයට පිළියෙලකොට 1969 නොවැම්බර් 7 දින හෝ ඊට පෙර "කර්මාන්ත ව්‍යවස්ථා අධ්‍යක්ෂ, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය, අංක 48, ශ්‍රී ජිනරතන පාර, කොළඹ 2" යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතුයි.

ඉල්ලුම් පත්‍ර, ඉල්ලුම්කරු සේවයේ නියුක්ත කර්මාන්ත ව්‍යාපාරයේ පාලක මණ්ඩලය මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම් පත්‍රයේ අවසානයේ දැක්වෙන සහතිකය එම මණ්ඩලය විසින් අත්සන් කළ යුතුයි. ලියුම් කවරයේ වම් පස මුදුන් කෙළවරේ "ශිෂ්‍යත්ව" යන්න ලිවිය යුතුයි. ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ ආර්ථික සහයෝගතා අමාත්‍යාංශය මගින් පිළියෙල වන මෙම ප්‍රදාන යන් පිරිනමනුයේ ශිෂ්‍යත්ව ස්වරූපයෙනි. ජර්මන් භාෂාව හැදෑරීම සඳහා අමතර කාලයක් සහිතව, තෝරා ගනු ලබන අපේක්ෂකයන් විසින් (දකුණු ජර්මනියේ ප්ලාස්ටික් මධ්‍යස්ථානය වන) "සුඩෙ උව්ෂෙ කන්ස්ටෝව්-ෂෙන්ට්‍රම්" ආයතනයේ මාස 12 ක ප්‍රායෝගික පුහුවණුක යෙදීම අවශ්‍ය වේ.

2. පුහුණුවීම් සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ, මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට අදහස් කෙරේ. එහෙත්, අයථා හැසිරීම්, අක්‍රමවත් පැමිණීම්, බල ධාරීන්ගේ අවසරය රහිතව පුහුණු වීම් සඳහා නොපැමිණීම හෝ ඉගෙනීමේ දියුවණුක් නොදැක්වීම යන කරුණු මත ප්‍රදානය කරනු ලබන ඒජන්සියේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව අවසන් කිරීමට ඉඩ ඇත. මෙවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට ලංකාවට පෙරළා පැමිණීමට සිදුවේ.

3. **සුදුසුකම්.**—අපේක්ෂකන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(i) ලංකා පුරවැසියන් වීම ;

(ii) 1970 නොවැම්බර් 1 වැනි දිනට වයස 30 ට අඩුවීම ;

(iii) රසායන විද්‍යාව හා භෞතික විද්‍යවා විෂයයන් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් සමත්වීම ;

(iv) ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන විෂයයෙහි යටත් පිරිසෙයින් අවුරුදු 2 ක වත් පළපුරුද්ද ;

(v) කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය මගින් අනුමත කරන ලද හෝ ලියා පදිංචි කරන ලද හෝ කර්මාන්ත ආයතනයක සේවයෙහි නියුක්තව සිටීම ;

(vi) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සෑහෙන ප්‍රවීණත්වයක් තිබීම.

4. **ශිෂ්‍යත්ව ප්‍රදානයට අදාල කොන්දේසි.**—අපේක්ෂකයා විසින් හෝ අපේක්ෂකයාගේ අයදුම් පත්‍රයට අනුග්‍රහය දක්වන සමාගම විසින් හෝ ජාත්‍යන්තර ගමන් වියදම් දැරිය යුතුවේ. ආහාර පාන හා නවාතැන් සඳහා වියදම්, ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ඒජන්සිය විසින් දරනු ඇත. නාම යෝජනා පිළිගනු ලැබුවායින් පසු ප්‍රදානයේ නියත කොන්දේසි සපයනු ලැබේ.

5. **සම්මුඛ පරීක්ෂණය.**—නියමිත ස්ථානයක හා නියමිත වේලාවක, කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට, සුදුසුකම් ලත් අපේක්ෂකයින් පෙනී සිටිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී තමාගේ සහතිකවල මුල් පිටපත්, උප්පැන්න සහතිකය හා ස්වකීය අපේක්ෂකත්වයට බලපාන වෙනත් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් සූදානම්ව සිටිය යුතුය.

6. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරා ගනු ලබන අපේක්ෂකයින් එතර පුහුණුවීම් ලැබීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් ඇති අයවළුන් බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සහතික කරනු ලැබීම අවශ්‍යවේ.

7. **ගිවිසුම් පත්‍රය හා පොරොන්දු පත්‍රය.**—මෙම පරිපාටිය යටතේ අවශ්‍යවන යම් යම් කොන්දේසි පිළිපදින බවට ඇප පොරොන්දු පත්‍රයක්ද සහිතව, රජයත් සමග ඇති කර ගන්නා ගිවිසුමකට තෝරා ගනු ලබන අපේක්ෂකයින් විසින් අත්සන් තැබිය යුතුවේ.

8. ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු ශිෂ්‍යත්ව ධාරියාට රක්ෂා ලබා දීමට රජය පොරොන්දු නොවේ.

9. ඉල්ලුම් පත්‍රයේ යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත්, අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරා ගනු ලැබූ අපේක්ෂකයෙකු ශිෂ්‍යත්ව ප්‍රදානය ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් ගතවනතුරු අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා වුවද ඔහු නුසුදුස්සෙකු ලෙස සළකනු ලැබේ

11. ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන අධිකාරීන්ගේ අභිමතය පරිදි නාම යෝජනා පිළිගනු ලබන හෙයින්, නාම යෝජනා කිරීම සඳහා තෝරා ගනු ලබන අපෙක්ෂකයින්ට ප්‍රදානයක් පිරිනමන බවට ස්ථිර සහතිකයක් දිය නොහැක.

12. යම් ඉල්ලුම්කරුවෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපෑමක් කිරීමට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඉල්ලුම්කරු ශිෂ්‍යත්වය ලැබීමට නුසුදුස්සෙකු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ අවශ්‍යතාවයන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකරන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ, කර්මාන්ත ව්‍යවස්ථා.

කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2,
1969 ඔක්තෝබර් මස 2 වැනි දින.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**ප්ලාස්ටික් නිෂ්පාදනයෙහි පුහුණුව සඳහා ඉල්ලුම් පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය :————.
4. ජාතිය :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. පසුගිය අවුරුදු 5 තුළ නියුක්තව සිටි රැකීරක්ෂා පිළිබඳ විස්තර :————.
   (දින සහිතව දැරූ තත්ත්වයන් පිළිබඳ විස්තර දක්වන්න.)
7. දැනට කරන රක්ෂාව :————.
   (දරන තනතුර පිළිබඳ විස්තර දක්වන්න.)
8. වතර්මනා සේවා යෝජකයාගේ නම හා ලිපිනය :————.

9. වර්තමාන සේවා යෝජකයාත්, තමාත් අතර ඇති නෑ සබඳකම් :————.

(ඇතොත් පමණක්)

10. දැනට නියුක්තව සිටින කර්මාන්තය පිළිබඳ විස්තර :——.

(අ) පිහිටීම :————.

(ආ) දැනට නිෂ්පාදනය කරන භාණ්ඩ :————.

(ඇ) භාණ්ඩ නිෂ්පාදනයේ උපයෝගී කර ගන්නා ක්‍රම පිළිබඳ කෙටි විස්තරයක් :————.

(ඈ) කර්මාන්තය පුළුල් කිරීම යනාදිය සම්බන්ධයෙන් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති වැඩ සටහන් :————.

(ඉ) 1967 හා 1968 යන වර්ෂවල නිෂ්පාදනයේ මුළු වටිනාකම :————.

(ඊ) දැනට පවතින කර්මාන්තයට යොදාගෙන තිබෙන උපකරණ :————.

(උ) දැනට පවතින කර්මාන්තයේ ආයෝජනය කර ඇති ප්‍රාග්ධනය :————.

(ඌ) කර්මාන්තය පිළිබඳව අමාත්‍යාංශයේ අනුමැතියේ හෝ ලියා පදිංචි කිරීමේ අංකය හා දිනය :————.

මවිසින් මෙහි ඉහත සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. පුහුණුවීමේ පාඨමාලාව සඳහා මා තෝරා ගනු ලැබුවහොත්, මගේ උපරිම ශක්ති ප්‍රමාණය යොද පුහුණුවීමේ පාඨමාලාව හැදෑරීමටත්, එම පුහුණුව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව පෙරළා දිවයිනට පැමිණීමටත් පොරොන්දු වෙමි. ඉහත සඳහන් ප්‍රතිඥා ඉටු කිරීමට මා අපොහොසත් වුවහොත්, මගේ පුහුණුව වෙනුවෙන් වැයවන සියළුම මුදල් ලංකාණ්ඩුවට ගෙවීමට පොරොන්දු වෙමි. ශිෂ්‍යත්වයක් සඳහා මා තෝරාගනු ලැබුවහොත් ඇප පොරොන්දු පත්‍රයකට හා ගිවිසුමකට ද අත්සන් තැබීමට මම මෙයින් පොරොන්දු වෙමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

————,

දිනය :————.

**පාලක පක්ෂයේ සහතිකය**

(ඉල්ලුම්කරු සේවකයෙක් නම් පමණක් පිරවීම පිණිස)

(අ) ඉල්ලුම්කරු මෙම සමාගමේ ස්ථිර සේවකයෙකු බවත්, ඔහු අවුරුදු..........ක කාලයක් අප වෙත සේවය කර ඇති බවත්, දැනට ඔහු..............තනතුර දරන බවත්, ඔහුට පවරා ඇති කටයුතු.................බවත් ;

(ආ) පුහුණුව නිම කිරීමෙන් පසු පෙරළා දිවයිනට පැමිණිවිට ................වශයෙන් මෙම සමාගම විසින් ඔහු නැවතත් සේවයෙහි යොදවන බවත් ;

(ඇ) ඉල්ලුම් පත්‍රයේ 10 වැනි කොටුවේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බවත් ;

මෙයින් සහතික කරමි.

(අත්සන හා තනතුරු නාමය)

දිනය :

10–560—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේඛන ලැයිස්තුගත කිරීමට හා සූචිගත කිරීමට හුදෙක්ම අනියම් පදනමක් මත උපාධිධරයන් හෝ අවසාන පරීක්ෂණයට පෙනී සිට සමර්ථවූ උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධි අපේක්ෂකයෙකු හෝ විය යුතුය.

(ආ) ඉල්ලුම්කරුවන් යටත් පිරිසෙයින් පහත සඳහන් විෂයයන්ගෙන් එකක්වත් උපාධි පරීක්ෂණයේදී සමත් වී තිබිය යුතුය.

(1) ඉතිහාසය

(2) පෙරදිග හෝ අපරදිග භාෂාවන්.

(ඇ) ඉංග්‍රීසි මනා දැනුමක් ඇති අයෙකු විය යුතුය.

(ඈ) වයස අවුරුදු 30 ට වඩා නොවැඩි විය යුතුය.

**දීමනාව.**—දිනකට සියල්ල අඩංගු (නියමිත) දීමනාව රු. 7.50 කි. මෙයට අමතරව වෙනත් දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

**සේවා කොන්දේ.**—පෝය දිනයන් හා රජයේ නිවාඩු දිනයන් හැර අන් සෑම දිනයන්හිම සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළ වැඩ කළ යුතුය. මෙම පත්වීම් ඉදුරාම අනියම් පදනමක් මත වන හෙයින්, රජය යටතේ ස්ථිර හෝ තාවකාලික හෝ පත්වීමක් සඳහා කිසිදු අයිතිවාසිකමක් හිමි නොවේ.

**ඉල්ලුම් පත්.**—පහත සඳහන් ආදර්ශ පෝරමය අනුව සිය අත් අකුරින් සකස් කළ ඉල්ලුම් පත්, නුගේගොඩ, ගංගොඩවිල, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ වෙත 1969.10.31 දිනට හෝ ඊට පෙර ලැබෙනසේ එවිය යුතුයි. අවශ්‍ය සුදුසුකම් නොමැති ඉල්ලුම්කරුවන්ගේ අයදුම්පත් දැන්වීමක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අමරවංශ දේවරාජ,
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ.

1969 ඔක්තෝබර් මස 6 වැනිදා,
නුගේගොඩ, ගංගොඩවිල,
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේදිය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේඛන ලැයිස්තු ගත කිරීම හා සූචි ගත කිරීමේ අනියම් සේවයට බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය**

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) වයස :————.

(4) ජාතිය :————.

(5) අධ්‍යාපන සුදුසුකම් :————.

(i) උපාධිධරයෙක් ද නැතහොත් උපාධි අපේක්ෂකයෙක් ද ? :

(i) උපාධිය සඳහා ගත් විෂයයන් සහ අවුරුද්ද :

(iii) විශ්ව විද්‍යාලය :

(iv) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් :

මේ අයදුම් පතෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවරදි බවට මෙයින් සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන

දිනය :————.

10–604—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ආධුනික සැළසුම්කරුවන් බඳවා ගැනීම

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආධුනික සැළසුම්කරු තනතුර සඳහා ඉල්ලුම්පත

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආධුනික සැළසුම්කරුවකු බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. **අවශ්‍ය සුදුසුකම් :—**

(i) අපේක්ෂකයෝ ලාංකිකයෝ විය යුත්තාහ.

(ii) ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට ඔවුනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 24 ට නොවැඩි විය යුතුය.

(iii) (අ) ඔව්හු මූලික ගණිතය විෂයයක් වශයෙන් ඇති ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළත්ව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේ සාමාන්‍ය පෙළෙන් සාමාර්ථය.

සහ

(ආ) ප්‍රායෝගික කාර්මික අභ්‍යාස ආයතනයේ එක් අවුරුදු පූර්ණ කාල දිවා පාඨමාලාව (සැළසුම්කරු පාඨමාලාව)

හෝ

(ඇ) ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක කණිෂ්ඨ කාර්මික නිලධාරි පාඨමාලාව (දෑවුරුදු) සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුත්තාහ.

**සටහන**

යථෝක්ත පාඨමාලාවන් හි 1969 අවසාන පරීක්ෂණ යට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුව සිටින අයටද ඉල්ලුම් කළ හැක.

3. **ඉල්ලුම්පත්.**—යට දක්වෙන ආකෘතියේ පරිදි පිළියෙල කරනු ලැබූ ඉල්ලුම් පත්, 1969.11.17 දින හෝ ඊට පෙර හෝ "තැ. පෙ. 529, කොළඹ 1, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, පහත දක්වෙන සහතිකයන් හි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය:—

(i) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය;

(ii) ලබා ඇති කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය;

(ii/) උප්පැන්න සහතිකය;

(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 3 ක්.

4. **වැටුප්.**—ආධුනික කාලය තුළ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 960—72×2—රු. 1,104.

5. **පත්වීමේ කොන්දේසි.**—ආධුනික සැළසුම්කරු තනතුර විශ්‍රාම වැටුප් රහිත තාවකාලික වන අතර, බඳවා ගනු ලැබූ අය රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක විය යුතුය.

6. **සේවා කොන්දේසි:**

(i) තෝරාගනු ලැබූ අපේක්ෂකයා නියමිත පාඩම් මාලාව අවංකව හා අනලස්ව හදාරා II පෙළ සැළසුම්කරුවකු වශයෙන් සුදුසුකම් ලබා ගැනීමටත්, පුහුණුව අවසන් කිරීමෙන් පසු නියම කරනු ලැබුවහොත් පස් වර්ෂයකට නොඅඩු කාලයක් II පෙළ සැළසුම්කරුවකු ලෙස දෙපාර්තමේන්තුවේ සේවය කිරීමටත්, බැඳෙමින් දෙපාර්තමේන්තුව සමග ගිවිසුම් පත්‍රයකට ඇතුළත් විය යුතුය.

මෙම කොන්දේසි හරියාකාර පිළිපැදීම සඳහා පුහුණුව ලබන්නා සහ ඔහුගේ දෙමව්පියන් හෝ භාරකරුවන් ඇප කරුවන් දෙදෙනෙකුද ඇතිව රුපියල් 2,000ක බැඳුම්කරය කට ඇතුළත් විය යුතුය.

(ii) ඉහත 2 (3) (ආ) ඡේදය යටතේ සුදුසුකම් ලබන අයදුම් කරුවකු තෝරා ගනු ලැබුවහොත් ඔහු දෙවර්ෂයක් ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතු අතර, 2 (Iii) (ඇ) ඡේදය යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවකු නම් එක් වර්ෂයකට ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතුය.

(iii) තෝරාගනු ලැබූ අය ප්‍රායෝගික පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් සහ නියමිත දෙපාර්තමේන්තු කාර්මික පරීක්ෂණයකින් සමත් වීමෙන් පසු පුරප්පාඩු ඇතොත්, II පෙළ සැළසුම්කරුවකු වශයෙන් පත් කරනු ලැබීමට සළකා බලන නමුදු එවැනි පත්වීමක් දෙන බවට දෙපාර්තමේන්තුව පොරොන්දු වන්නේ නැත.

(Iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට කාර්යාල ඇතුළත මෙන්ම එළිමහනේද රාජකාරි කිරීමට සිදුවිය හැක.

(v) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාත්, විශේෂයෙන් වර්ෂ 1956යේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පනවා ඇති විධිවිධාන මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව තෝරාගනු ලැබූ අය ක්‍රියා කළ යුතුය.

(vi) රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධිවිධාන සහ අණපනත්වලට හා ආණ්ඩුව විසින් කලින් කල නිකුත් කරනු ලබන සෙසු විධානවලටද ඔහු යටත් වනු ඇත.

7. මෙම ගැසට් පත්‍රයේ II වන කාණ්ඩයේ 1 වන කොටසේ දක්වා ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට අදාල සාමාන්‍ය කොන්දේසිවලටද අවධානය යොමු කෙරේ.

8. ඉල්ලුම් පත් ලැබුණු බැව් එක් එක් අයදුම්කරුවන්ට දන්වනු නොලැබේ.

අමරදාස ගුණවර්ධන,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1969 ඔක්තෝබර් මස 7 දින.

### ආදර්ශ ආකෘතිය

**ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආධුනික සැළසුම්කරු තනතුර සඳහා ඉල්ලුම්පත**

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. (i) ජාතිය :————.

(ii) ලාංකික නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් යන්නත් ලියාපදිචි වීමෙන් නම් ලියාපදිංචි වීමේ සහතිකයේ අංකය හා දිනයත් සඳහන් කරන්න:—

4. උපන් දිනය.————.

1969. 11. 17 දිනට වයස :————.

5. පහත සඳහන් අයගේ සම්පූර්ණ නම් හා ලිපිනයන් සඳහන් කරන්න:—

(i) පියා :————.

(ii) මව් :————.

(iii) දෙමව්පියන් නොමැති නම් භාරකරු :————.

6. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.

7. ලබා ඇති උසස්ම කාර්මික සුදුසුකම් :————.

8. චරිත සහතික නිකුත් කර ඇති අයගේ නම් සහ ලිපිනයන් :——.

9. පාසැලෙන් අස්වූ පසු රක්ෂාවක යෙදී සිටියේ නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

10. ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදී බවත්, මා උසාවියකින් වරදකරු වී හෝ රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබ හෝ නොමැති බවත් සහතික කරමි. මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි සහගත බව තෝරාගනු ලැබීමට ප්‍රථම එළිදරව් වුවහොත් මාගේ ඉල්ලුම් පත්‍රය නිෂ්ප්‍රභා කරනු ලැබීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු එළිදරව් වුවහොත් මා කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටද හේතු වන බව මම දන්වමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–600—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ගුණානන්ද මාවත 'ඒ' ශ්‍රේණියේ උප තැපැල් කාර්‍යාලයේ උප තැපල් ස්ථානාධිපති ධූරය

කොළඹ 13, ශ්‍රී ගුණානන්ද මාවත උප තැපැල් කාර්යාලයට උප තැපැල් ස්ථානාධිපති වරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අඩුම මාසික දීමනාව රු. 75කි.

1. 1969. 11. 18 වැනි දිනට ඉල්ලුම්කරුවන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම වයස අවුරුදු 21ට වැඩි සහ අවුරුදු 45ට අඩු ලාංකිකයන් විය යුතුයි.

2. ඉල්ලුම්කරුවන් අවුරුදු 10ක් හෝ ඊට වැඩි කාලයක සිට නගර සහා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. උප තැපැල් කාර්යාලය පිහිටි නගර සහා කොට්ඨාශය තුළ සහ යාබද කොට්ඨාශවල පදිංචි අයදුම්කරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. ඉල්ලුම්කරුවන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/මූලික ගණිතය ඇතුළුව අඩු වශයෙන් විෂයයන් තුනකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික විභාගය/අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත්වී තිබිය යුතුයි.

4. ශ්‍රී ගුණානන්ද මාවත උප තැපැල් කාර්යාලය පවත්වාගෙන යෑමට සුදුසු ගොඩනැගිල්ලක් කුලී රහිතව ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි.

5. කොළඹ 1, ඇචිලන් චතුරශ්‍රයේ අංක 5 දරණ ගොඩනැගිල්ලේ පිහිටි (බටහිර දකුණ) කොට්ඨාශයේ ප්‍රාදේශීය තැපැල් අධිකාරි තුමාගෙන් ඉල්ලුම් පත් සඳහා මුද්‍රිත පෝර්ම ලබාගෙන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 1969. 11. 18 වැනි දින හෝ ඊට ප්‍රථම ඔහු වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

තවදුරටත් විස්තර අවශ්‍ය නම් ප්‍රාදේශීය තැපැල් අධිකාරී තුමාගෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට් මාස්ටර් ජනරාල් සහ
විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

10–699—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුර කොට්ඨාශයේ එලමල්පොත ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය

මාතලේ උතුර මුස්ලිම් විවාහ කොට්ඨාශයේ එලමල්පොත ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොටගෙන සැලකුම් ලබන විවාහක පිරිමි මුස්ලිම් අයවලුන් ගෙන් ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කායාීලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායාීලය, ග්‍රාම සේවක කායාීල, පළාත් පාලන ආයතන කායාීල, ග්‍රාමීය උසාවි, තැපැල් කායාීල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පෙළවල් සහ සමූපාකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායාීලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වලට ඇතුළත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කායාීලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 නොවැම්බර් 30 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඇල්. බී. උඩලාගම,
දිස්ත්‍රික් ලේකම්.

1969 ඔක්තෝබර් මස 6 වෙනි දින,
මාතලේ දිස්ත්‍රික් ලේකම් කායාීලයේ දීය.

10-685

---

## ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

සංයුක්ත මණ්ඩලයේ, පුල්මුඩේ යන්ත්‍රාගාරයට වෛද්‍ය නිලධාරියකු පත්කර ගැනීම සඳහා ලාංකිකයන් ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—ඇම්. බී. බී. ඇස් සහ අභ්‍යන්තර පුහුණුවෙන් පසු අවුරුදු 3 ක පළපුරුද්ද තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය.**—රු. 1,150—50—1,400 සියළු දීමනා අඩංගු මාසික වැටුප් පරිමාණය.

**සේවා කොන්දේසි :**

(1) මෙය ස්ථිර තනතුරක් වන අතර, තෝරා ගනු ලබන අයදුම් කරුට මණ්ඩලීය අණපනත් යටතේ අර්ථසාධක අරමුදලේ වරප්‍රසාද ලැබෙනු ඇත.

(2) පත්වීම මුල් වතාවට අවුරුදු 3 ක ප්‍රවාසන කාලයකට යටත් වේ.

(3) රජයේ භාෂා ප්‍රතිපත්තියට යටත් විය යුතුවේ.

(4) තෝරා ගනු ලබූ අයදුම්කරු පුල්මුඩේ අප යන්ත්‍රාගාරයේ නැවතී, පුල්මුඩේ සහ චීනවරායේ පිහිටි යන්ත්‍රාගාර දෙකේම සේවය කළයුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමටද සූදානම් විය යුතුයි.

නියමිත ආකෘති පත්‍ර නොමැත. අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, වයස ඇතුළු වෙනත් අවශ්‍ය තොරතුරු සඳහන් ඉල්ලුම් පත්‍ර උප්පැන්න සහතිකයෙත්" පළපුරුද්ද පිළිබඳ සහතිකවලත් පිටපත් අමුනා 1969 දෙසැම්බර් මස 15 වෙනි දිනට හෝ ඊට පෙර, කොළඹ 7, 22/2 තර්ස්ටන් පාරේ ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුයි. නැතිනම් කාර්යාලයට පැමිණ භාර දිය යුතුයි.

සෝ. ඉහලහේවා,
ලේකම්/සේවක නිලධාරි(
ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය.

22/2, තර්ස්ටන් පාර,
කොළඹ 7, 1969, ඔක්තෝබර් මස 4 දින.

10-625

---

## සමූපකාර තොග වෙළඳ සංස්ථාව
### උපාධිධාරී භාෂා පරිවර්තක තනතුර (දෙමළ)

පහත සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයින්ගෙන් ඉහත දැක්වෙන තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ :—

(අ) අඩුම අධ්‍යාපන සුදුසුකම් : විෂයයක් වශයෙන් දෙමළ භාෂාව හා ඉංග්‍රීසි භාෂාව හදාරන ලද පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතු ය.

එසේ නැතහොත්

දෙමළ භාෂාවෙන් ගෞරව සහිත උපාධියක් හා අතිරේක විෂයයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාව හදාරා තිබිය යුතුය.

(ආ) වයස : 1969. 10. 27 දිනට වයස අවුරුදු 40 ට වැඩි නොවිය යුතු ය.

වැටුප් ශ්‍රේණි : මසකට රු. 585—රු. 25×10—රු. 835—(සියල්ල ඇතුළුව)

අර්ථසාධක අරමුදල : සේවකයාගෙන් සියයට 10 හා සේව්‍යයාගෙන් සියයට 15 ක් වේ.

රජයේ සේවකයින්ගේ සහ රජයේ සංස්ථාවල සේවකයින්ගේ ඉල්ලුම් පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු අතර, ඒවා සලකා බලනු ලබන්නේ තෝරාගනු ලබන අයදුම්කරු නිදහස් කිරීමට එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් එකඟ වන්නේ නම් පමණි.

පහත දැක්වෙන ෆෝර්මයට අනුකූල වන සේ පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969. 10. 27 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, වැක්ෂෝල් වීදියේ අංක 21 දරණ තැන සතොස සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත ලැබෙන සේ එවිය යුතුය.

සේවක මණ්ඩල් කළමනාකරු.

ස.තො.ස. මූලස්ථානය,
අංක 21, වැක්ෂෝල් වීදිය,
කොළඹ 2. 1969. 10. 6.

### ආදර්ශ ෆෝර්මය

.................................... **තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. නම සහ ලිපිනය :————.
2. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.) :————.
3. ජාතිය :————.
4. අධ්‍යාපනික සුදුසුකම් :————. (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)
5. පළපුරුද්ද :————.
6. අයදුම්කරුගේ හැකියාව සහ චරිතය ගැන තොරතුරු අසා බැලිය හැකි සැළකිය යුතු තත්වයක් දරණ පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.

මෙම ඉල්ලුම් පතෙහි මවිසින් සඳහන් කර ඇති කරුණු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-695

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ හැටහයේ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ හැටහයේ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1969.11.17 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කෝරළය තුළ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් වත් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම් පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් සහ සේවකයන් ද, මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත් භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුවේ.

හී. බ. දිසානායක,
කුරුණෑගල දිසාපති.

1969.9.25 දා,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේ දීය.

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. සථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස: ————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කෙළේද? එසේ නම් එය පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිවී සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර: ————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී උසාවියකින් දඬුවම් ලබා තිබේද? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–689—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥයින් බඳවා ගැනීමේ විභාගය

සෞඛ්‍ය දෙපාතීමේන්තුවේ II වන ශ්‍රේණියේ වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥයින් හැටියට පුහුණු කරවා පත් කැරගනු පිණිස, ගැහැණු පිරිමි දෙගොල්ලන්ගෙන් මැ අයැදුම්පත් කැඳවනු ලැබේ. මෙහි මතු දැක්වෙන ආදශී ආකෘති පත්‍රය අනුකරණයෙන් පිළියෙල කොටැ, විදි පරිදි අවලංගු කරන ලද රු. 25 ක වටිනාකම ඇති මුද්දර ගැසූ අයැදුම් පත්, 1969 නොවැම්බර් 17 වන දා හෝ ඊට පෙර, හෝ මා වෙත ලැබෙනු පිණිසැ ලියා පදිංචි තැපෑලෙන් එවියැ යුතු යැ. කිසිදු හේතුවක් නිසාවත් මුද්දරවලැ අගය ආපසු ගෙවීමෙක් නැති, විභාගයේ නම ලියුම් කවරයේ වම් පැත්තේ මුදුනෙහි ලියා තැබියැ යුතු යැ. අයැදුම් පත් පියවන දිනට පසු තැපැල් කරනු ලබන අයැදුම් පත් බාර ගනු නො ලබේ.

2. වැටුප් ක්‍රමය.—(ඒකාබද්ධ)

(අ) විශේෂ ශ්‍රේණිය—අවුරුද්දකට රු. 8,280—240×4—රු. 9,240.

(ආ) I වන ශ්‍රේණිය—අවුරුද්දකට රු. 6,600—180×8—රු. 8,040.

(ඉ) II වන ශ්‍රේණිය—අවුරුද්දකට රු. 3,864—144×18—රු. 6,456.

(තෝරාගනු ලබන අපේක්ෂක—අපේක්ෂිකාවන්ට කාර්යක්ෂමතා කඩ ඉම් පිළිබඳ වග තුග දන්වා එවනු ඇත.)

සැලැකිය.—කිසි දු විටෙකැ I වන ශ්‍රේණියේ පත්වීම් ගණන II වන ශ්‍රේණියේ ගණනින් හතරෙන් පංගුවක් නො ඉක්මවනු ඇත. I වන ශ්‍රේණියට පත් කරනු ලබන්නේ II වන ශ්‍රේණියේ සිටින නිලධාරීන් ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය හා අනුවැ ඉහළ නැංවීමෙනි.

3. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා තතු.—

(i) මෙම තනතුරු වූ කලී විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරු වේ. තෝරා ගනු ලබන පිරිමි අයදුම්කරුවන් වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වනවා ඇත.

(ii) තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට දෑවුරුදු කාලයක අභ්‍යාස පාඨ මාර්ගයක් හදාරන සේ නියම කරනු ඇත. රසායන රෝග—නිධාන විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, රුධිර විද්‍යාව සහ ලේ බැංකු මාස්තු විද්‍යාව, පරපොෂිත විද්‍යාව, සහ කීට විද්‍යාව, බෞතික රෝග-නිධාන විද්‍යාව සහ පරීක්ෂණාගාර කළමනාකාරය යන විෂයෙහි දෙසුම් සහ ප්‍රායෝගික පාඩම්වලට පළමු අවුරුද්ද සීමා කරනු ඇත. දෙවන අවුරුද්ද සීමා වාසික පුහුණුවක් සඳහා යොදවනු ඇත. දෙවන අවුරුද්ද කෙළවර දී විභාගයෙකි. එයින් එගොඩ නොවන අපේක්ෂකයින්ට විභාගකාර මණ්ඩලයේ නිර්දේශය පරිදි හය මාසයක් ඇතුළත තවත් දෙවතාවක් ඉඩ දෙනු ලැබේ. පුහුණුව ලබන කාල-සීමාව ඇතුළත යම් අපෙක්ෂකයෙකුගේ වැඩ සහ හැසිරීම අසතුටුදායක බව පෙනී යයි ද එවිටැ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අභිමතය පරිදි ඒ අපේක්ෂකයා පංතියෙන් නැවැත්වීම හෝ හය මාසයකට නොවැඩි කාලයකින් පුහුණුවේ කාලය දිගු කිරීමට හෝ ඉඩ තිබේ. දෑවුරුදු අභ්‍යාස පාඨ මාර්ගය සඵල ලෙස හදාරා නිම කළ විටැ ඔවුන්ට වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික වේදය විෂයයෙහි නිපුණතා සහතික නිකුත් කොටැ, ඇබෑර්තු ඇතිවන ඇතිවන හැටියට, 3 අවුරුදු ආධුනික කාලයක් පිටැ II වන ශ්‍රේණියේ වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥයින් හැටියට ඔවුහු පත් කරනු ලබත්.

(iii) අපේක්ෂකයින් ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලබන්නේ දෙවන අවුරුද්ද කෙළවරැ දී පැවැත්වෙන විභාගයේ ප්‍රතිඵල උඩ යි. යම් අපේක්ෂකයෙකුගේ පුහුණු සමය කවර හේතුවක් නිසා හෝ දිගු කරනු ලැබුවහොත්, ඒ අපේක්ෂකයා සෙසුසන්ට වඩා කණිෂ්ඨ වේ.

(iv) පුහුණු සමය තුළැ පළමු අවුරුද්දේ දී අවුරුද්දකට රු. 3,000 බැගින් වූ දීමනාවක් ද, දෙවන අවුරුද්දේ දී රු. 3,144 බැගින් දීමනාවක් ද ගෙවනු ලැබේ.

(v) පුහුණුව සඳහා පංතියට බාර ගනු ලබන අපේක්ෂකයින්ට එසේ පංතියට ඇතුළත් වූ දා සිටැ හත් අවුරුදු කාලයක් මුල්ලේ දෙපාතීමේන්තුවට සේවය කරන බවට ත්, එය ඉටු නො කළොත් පුහුණු සමය තුළැ දී ලැබූ වැටුප්, දීමනා යනාදි සියලු මිල-මුදල් ආපසු ගෙවන බවටත් පොරොන්දු වෙමින් ගිවිසුමකට සහ ඇප කරුවන් සහිත ඇපකරයකට බැඳෙන ලෙස නියම කරනු ඇත.

(vi) පරීක්ෂණාගාර උප සහායකයින් හා III වන ශ්‍රේණියේ වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥයින් හා අතුරෙන් තෝරාගනු ලබන අපේක්ෂකයෝ, පුහුණුවීමේ සමය තුළැ වැඩ බැලීමට පත් කරනු ලැබ, ඉහත (III) වැන්නේ දැක්වෙන විභාගයෙන් සමත් වන දින සිටැ සිය පත්වීම ස්ථිර කරනු ලබත්. විභාගයෙන් සමත් වීමට අපොහොසත් වීම කලින් ශ්‍රේණියට හරවා යවනු ලැබීමට හේතු වේ.

(vii) සත් දින වැඩකරුවන්ගේ ගණයට වැටෙන වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥයෝ, පෝය දිනය ද, රජයේ නිවාඩු දින ද ඇතුළු සතියේ සත් දිනයේම වැඩ කළ යුතු වේ. සතියේ කවර දිනකැ වුවද, දිවා-රෑ කවර වේලාවකැ වුවද, සේවයට කැඳ වූ විටෙකැ පැමිණීමට ඔවුන් සූදානමින් සිටිය යුතු යි. දිවයිනේ කවර පෙදෙසකැ වුවද සේවය කිරීමට ඔවුහු බැඳී සිටිති.

(viii) පත් කරනු ලබන අපේක්ෂකයෝ, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසත්, විශේෂයෙන්මැ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි-විධාන ක්‍රියාවට නැගීම පිණිසත් මෙතෙක් පනවා තිබෙන්නාවූ හෝ මින් මතු පනවනු ලබන්නා වූ හෝ කවර නීති නියෝගාදියක් වුව ද පිළිපැදිය යුත්තාහ.

(ix) එසේ පත්වීම් ලබන්නෝ, සිය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල විෂයයෙහි ප්‍රවීණතාවය ලැබිය යුතු යි. ආධුනික/පරීක්ෂා කාලය ගෙවී යාමේ දී ඔවුන්ගේ පත්වීම ස්ථිර කිරීම පිණිසැ ඔවුන් වෙත තිබිය යුතු එක් සුදුසුකමකි සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් වී සිටීම.

(x) සිය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත නියමිත තත්ත්වයේ සිංහල ප්‍රවීණතාවය ලැබීමට අපොහොසත් වන අය සේවයෙන් තවත්වනු ලැබීමට ඉඩ තිබේ.

(xi) රාජ්‍ය සේවයට ඇතුළු වීමට සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන නිලධාරීන්, සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

11. ඇයැදුම් පත් හෝ ඒ සම්බන්ධ වෙනත් අනෙක් ලියුම් කියුම් හෝ එවියැ යුත්තේ කොළඹ 1 සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂට පිට නම ලියා මිසැ, මේ දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියෙකුට නමින් අමතා නොවේ.

12. මේ ගැසට් පත්‍රයේ 1 වන කොටස (II) වන ඡේදය ආරම්භයේ පළ වී ඇති, රාජ්‍ය සේවා තනතුරුවලට දෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසි ද කියවා බැලීම වටී.

වී. පී. ඒ. පෙරේරා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලක),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1969.10.7 වන දින, කොළොඹ,
තැ. පෙ. අංක 500 හිමි,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කායභාලයේ දීය.

### එකී ඇයැදුම් පතේ ආකෘතිය

**II වන ශ්‍රේණියේ වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මික විද්‍යාඥ තනතුරට ඇයැදුම් පත**

1. (අ) පෙළපත් නම මුලට යොදා මුළු නම :————.
   (ආ) ලිපිනය :————.

2. (අ) 1969.11.17 වන දාට නියම වයස :————.
   අවුරුදු........... මාස........... දින...........
   (ආ) උපන් දිනය සහ තැන :————.
   (ඉ) ගැහැණු පිරිමි බව :————.

3. ජාතිය :————.

4. විවාහක ද තනිකඩද යන වග :————.

5. මීට ඇතුළත් වීමට සුදුසුකම් ලබමින් සමත් වූ විභාගය; ඒ විභාගයේ දිනය, විභාග අංකය, මධ්‍යස්ථානය, සමත් විෂය යන තොරතුරු සමග :————.

6. පාසලෙන් අස්වීමෙන් පසු කළ රැකියා :————.

7. විශේෂ පුහුණුවක්, සුදුසුකම් නැත්නම්, පළපුරුද්දක් ලබා ඇත්නම් ඒ පිළිබඳ වගතුග :————.

8. අපේක්ෂකයා/අපේක්ෂිකාව විභාගයට පෙනී සිටීමට කැමති කවර භාෂා මාධ්‍යයෙන් ද ?
   (අ) භාෂාව සහ රචනය—
   (ආ) රසායන විද්‍යාව—
   (ඉ) භෞතික/උද්භිද/සත්ව/ජීවවිද්‍යාව—
   මෙයින් තමන් ගන්නා විෂය ද දක්වන්නැ).
   (ඊ) සාමාන්‍ය බුද්ධිය.

මේ ඇයැදුම්පතෙහි ම විසින් සපයන්නට යෙදුණු වගතුග, සැබෑ බවත්, හරි බවත් මෙයින් සහතික කරමි. මෙහි දැක්වූ යමක් බොරු බව හෝ වැරදි බව හෝ පසු විටෙකැ දැනැ ගන්නට ලැබුණොත්, අපේක්ෂකයින් තෝරීමට කලින් නම් මා නුසුදුස්සෙකු සේ සැලැකෙන බවත්, පත් කිරීමෙන් පසු ඒ වරද හසු වුවොත් වන්දි කිසිත් නොලැබ සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බවත් මම පිළිගනිමි.

රු. 25 මුද්දර
අපේක්ෂකයා මුද්දරය උඩැ අත්සන් කළ යුතු යි.

දිනය :————.

10-667—69 .8.8 දින අංක 14,೬66 දරන ගැසට් පත්‍රය

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### සංශෝධනය

**රාජකීය ලංකා ගුවන් හමුදාවෙ ඒකල කඳවුරේ ගුවන් භටයින්ට විවාහක නිවාසයක් තැනීම සඳහා**

අංක : ..................... දරණ ලංකාණ්ඩුවේ 69.10 2 ගැසට් පත්‍රයේ I කොටසේ II ඡේදයේ පළවු දැන්වීමේ I ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුයි.

රාජකීය ලංකා ගුවන් හමුදවේ ඒකල කඳවුරේ ගුවන් භටයින්ට විවාහක නිවාසයක් තැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 ඔක්තෝබර් 26 වැනි ඉරිදා පෙරවරු 10 දක්වා කොළඹ 2 කේ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ තැ. පෙ. 594 රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් භාරගනු ලැබේ.

එම්. එස්. මාරුප්,
ස්කොඩ්රන් ලීඩර්, ප්‍රධාන වැඩ නිළධාරී,
ගුවන් හමුදපති වෙනුවට.

10–662—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

### “ මයිලව් ” නමැති මෝටර් බෝට්ටුව විකිණීම

කොළඹ වරායේ තිබෙන “ මයිලව් ” නමැති මෝටර් බෝට්ටුව මිළදී ගැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. බෝට්ටුවේ විස්තර පහත දැක්වේ :—

යාත්‍රාවේ වර්ගය ... ආරක්ෂිත ජලාශයන්හි සහ වරායවල් තුළ සාමාන්‍ය පාවිච්චිය සඳහා fපයිබර් ග්ලාස් බෝට්ටු කඳ.

ප්‍රමාණය ... 15′ 0″ × 5′ 6″ × 2′ 6″

.. තිරිංග අශ්වබල 40 කින් යුත් පිටතින් පැදවිය හැකි එවින්රුඩ් ඇන්ජිමක්.

මෙම බෝට්ටුව කොළඹ වරායේදී පරීක්‍ෂාකොට බැලිය හැක. මෙම බෝට්ටුව පරීක්‍ෂාකර බැලීමට කැමති අයෙකු කොළඹ 1, එළිසැබත් ජැටියේ, වෙළඳ නැව් දෙපාර්තමේන්තුවේ, ෂිපිං මාස්ටර් වෙත අයදුම් කළ යුතුය.

2. කොළඹ 1, රේගු නිවසේ නැව් සුන්බුන් භාරගැනීමේ නිලධාරියාගේ කායභාලයේදී 1969.10.31 වැනි දින පස්වරු 2 ට ටෙන්ඩර් භාරගැනීම අවසන් කරනු ඇත.

1969.10.31 වැනි දින පස්වරු 3 ට කොළඹ 1, නැව් සුන්බුන් භාරගැනීමේ නිලධාරියාගේ කායභාලයේදී ටැන්ඩර්පත් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

3. 1969.10.26 වැනි දින පස්වරු 2 දක්වා ෂිපිංමාස්ටර්ගේ කායභාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පිළියෙලකොට අනුපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ෂිපිංමාස්ටර්ගේ කායභාලයේදී රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත්කොට, ඒ සඳහා ලබාගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. විකිණීම සාර්ථක ලෙස අවසන්වූ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පත් පැහැදිලිව ලිවිය යුතුවන අතර, සියලුම වෙනස් කිරීම් සහතික කළ යුතුය.

4. ටෙන්ඩර්පත් කොළඹ 1, රේගු නිවසේ, නැව් සුන්බුන් භාරගැනීමේ නිලධාරි කායභාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීමට හෝ ලියාපදිංචි කළ තැපැලෙන් එවීමට හැක. සියලුම ටෙන්ඩර්පත් නැව් සුන්බුන් භාරගැනීමේ නිලධාරි නමට එවිය යුතු වන අතර, එය එවන ලියුම් කවරයේ වම් පසෙහි ඉහළ කෙළවරේ “ මයිලව් ” නමැති මෝටර් බෝට්ටුව මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් යනුවෙන් ලිවිය යුතුය.

5. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් මිළ ගණනකට අමතර වශයෙන් රු. 1,000 ක මුදලක් රේගු ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. සාර්ථක ටෙන්ඩර්කරු විසින්, ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව ඔහුට දැන්වීමෙන් සතියක් තුළදී, මෙම විකිණීම අවසන්කොට බෝට්ටුව භාරගත යුතුය. එසේ කිරීමට අසමත් වුවහොත්, ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකකොට, නැව් සුන්බුන් භාරගැනීමේ නිලධාරියාගේ අභිමතය පරිදි, මෙම බෝට්ටුව නැවත විකුණනු ලැබේ.

නැව් සුන්බුන් භාරගැනීමේ නිලධාරියා විසින් කිසිම හේතුවක් නොදක්වා, යම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ බලය ඔහු සතුව ඇත.

ඒ. ඊ. පණ්ඩිතරත්න,
නැව් සුන්බුන් භාරගැනීමේ නිලධාරි.

වෙළඳ නැව් දෙපාර්තමේන්තුව,
එළිසබෙත් ජැටිය,
කොළඹ 1.
1969 ඔක්තෝබර් මස දින.

10–687—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### මඩකලපුව දිස්ත්‍රික්කයේ වඩමුනේ ව්‍යාපාරයේ ජනපද නිලධාරී නිවාස ආදිය තැනීම සඳහා ටෙන්ඩර්

ඉහත සඳහන් ව්‍යාපාරයෙහි මතු දැක්වෙන ගොඩනැගිලි ආදිය තැනීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1969.11.7 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

| | | |
|---|---|---|
| ජනපද නිලධාරී නිවාස | ... | 1 යි |
| ජනපද නිලධාරී කාර්යාලය | ... | 1 යි |
| කාර්යාධිකාරී නිවාස | ... | 1 යි |
| ළිං | ... | 1 යි |

2\. 1969.11.6 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක, අනුපිටපතකුත් සමග, ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3\. රිසිට් පත්, තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4\. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකිවුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5\. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වඩමුනේ ව්‍යාපාරයේ ජනපද නිලධාරී නිවාස ආදිය තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ප්‍රධාන ගණකාධිකාරී තැන වෙත භාර දීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6\. ටෙන්ඩර් ස්ථිර වුවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේය.

7\. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට නව (9) මසක් ඇතුළත වැඩය නිමකළ යුතුය.

8\. සාර්ථකවූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දන්වූ කල්හි, පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේය.

9\. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969.11.7 දින පෙ. ව. 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10\. ටෙන්ඩර්කරුවන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ අවම වශයෙන් රු. 50,000 කට රෙජිස්ටර් වුවන් විය යුතු අතර ටෙන්ඩර් පත් ලබා ගැනීමේදී එම රෙජිස්ටර් වීම ඔප්පු කළ යුතුය.

11\. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවගීයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12\. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාර ගැනීමේ බලය රජය සතුවේ.

13\. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ 69.10.8,
සිඊ/2?—395

10–675—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගිරිතලේ ව්‍යාපාරයෙහි ගුරු නිවාස ආදිය තැනීම සඳහා ටෙන්ඩර්

ඉහත සඳහන් ව්‍යාපාරයෙහි මතු දක්වෙන ගොඩනැගිලි ආදිය තැනීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1969.11.14 දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| ගුරු නිවාස | ... | ... | 2 යි. |
| වතුර ටැංකි | ... | ... | 1 යි. |
| ළිං (විෂ්කම්භය අඩි 8) | ... | ... | 1 යි. |

2\. 1969.11.13 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක, අනුපිටපතකුත් සමග, ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3\. රිසිට් පත්, තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4\. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකිවුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5\. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ගිරිතලේ ව්‍යාපාරයෙහි ගුරු නිවාස ආදිය තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ප්‍රධාන ගණකාධිකාරී තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6\. ටෙන්ඩර් ස්ථිර වුවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේය.

7\. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට හය මසක් ඇතුළත වැඩය නිම කළ යුතුය.

8\. සාර්ථකවූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දන්වූ කල්හි, පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේය.

9\. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969.11.14 දින පෙ. ව. 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10\. ටෙන්ඩර්කරුවන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ අවම වශයෙන් රු. 50,000 කට රෙජිස්ටර වුවන් විය යුතු අතර ටෙන්ඩර් පත් ලබා ගැනීමේදී එම රෙජිස්ටර් වීම ඔප්පු කළ යුතුය.

11\. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවගීයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12\. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාර ගැනීමේ බලය රජය සතුවේ.

13\. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 69.10.8.
සිඊ/2/396.

10–680—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ගාලු වරායේ රුමස්සල වැඩපලේ ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාල සීමාවකට යථෝක්ත ආපන ශාලාව බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1969.10.30 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම ෆෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1969.10.28 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්ම සමග නිකුත් කරනු ඇත.

10-686—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ගාල්ල ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ගබඩාවෙහි ඇති ප්‍රයෝජනයට ගත නොහැකි දුව මිළයට ගැනීම හා ගෙනයාම සඳහා ටෙන්ඩර් කැඳවීම

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගාල්ල කොට්ඨාශයෙහි බූස්ස ප්‍රාදේශීය ගබඩාවේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි දුව මිළයට ගැනීම සහ ගෙනයෑම පිණිස, ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1969 නොවැම්බර් මස 11 වෙනි දින දවල් 12.00 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. සියලුම ටෙන්ඩර් පත් 1969 නොවැම්බර් මස 24 වෙනි දින දවල් දොළහ දක්වා ගාල්ල ඉඩම් සංවර්ධන නිළධාරීන්ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පුරවා පිටපත් දෙක බැගින් යුතුව එවිය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පෙර, ගාල්ල ඉඩම් සංවර්ධන කායඊාලයේ හෝ ඕනෑම කච්චේරියක මෙම කායඊ සඳහා රුපියල් 50 මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

3. සෑම ටෙන්ඩර් පත්‍රයකම කවරයේ වම්පස මුදුනේ "ප්‍රයෝජනයට ගත නොහැකි දැව මිළදී ගැනීම හා ගෙනයෑම සඳහා ටෙන්ඩර් පත්" යන්න ලියා මුද්‍රා තබා ගාල්ල, ඉඩම් සංවර්ධන නිළධාරි වෙත එවිය යුතුයි. කවරයේ වම්පස පහළින් ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත් එවිය යුත්තේ ලේඛනගත තැපෑලෙනි. නැතහොත් ගාල්ල, ඉඩම් සංවර්ධන කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිළධාරි තැනගේ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

4. ගාල්ල, ඉඩම් සංවර්ධන නිළධාරි තැනගේ කායඊාලයේදී 1969 නොවැම්බර් මස 25 වෙනි දින පස්වරු 2.30 ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවනට අවශ්‍යයැයි හැඟී යන්නේ නම් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ එහි පැමිණ සිටිය හැක.

5. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට අදහස් කරන අය මෙම දැව තොගය, බූස්ස ගබඩාවේදී කායඊාල වේලාවන්හිදී පරීක්ෂා කළ හැකි අතර, එම දැව ලැයිස්තුවක් මගේ කායඊාලයෙන් හෝ බූස්ස ගබඩාවෙන් ලබාගත හැක.

6. මෙම දුව සියල්ලම හෝ ඉන් කොටසක් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුත්තේ එහි සඳහන් එක් එක් දැව සඳහා වූ මිළ ගණන වෙන් වෙන් වශයෙනි.

7. තෝරාගත් ටෙනඩර් කරුවන් හට ඒ බව දන්වා දස දිනක් ඇතුළත මුළු මුදලම ගෙවිය යුතුයි. එසේ මුදල් ගෙවා දින දහහතරක් ඇතුළත එම දුව ගෙනයා යුතුයි. ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපෑලෙන් යැවීමෙන් හෝ එහි ස්ථානයේ තැබීමෙන් හෝ ටෙන්ඩරය භාරගත් බව ඔහුට දැන්වූවාසේ සලකනු ලැබේ. ගාල්ල ඉඩම් සංවර්ධන නිළධාරි විසින්, වෙන අන්දමකට තීරණය නොකළ හොත්, නියමිත කාලසීමාව තුළදී රැගෙන නොගොස් ගබඩාවේ ඉතිරි වන දුව නැවත විකුණා දැමීමට හෝ වෙනත් සුදුසු දෙයක් හෝ කිරීමට ඉඩ තිබේ. එවිට ටෙන්ඩර්කරුවනට එම දුව සඳහා කිසිම අයිතිවාසි කමක් ඉදිරිපත් කළ නොහැක.

8. (අ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනට කලින් ටෙන්ඩර්ය අස්කර ගන්නා බව නොදැන්වූවහොත් හෝ (ආ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ඒවා නොඑවූවහොත් හෝ (ඇ) ටෙන්ඩරය තෝරාගත් බව දැන්වීමෙන් පසුව නියමිත කාලසීමාව තුළදී මුදල් නොගෙවා හෝ දුව ඉවත් නොකර හැරියොත් හෝ තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

9. තෝරාගත් ටෙන්ඩර්කරුවෙකු දැව ගෙනයෑම ප්‍රතික්ෂේප කළ හොත් හෝ ගෙන යෑමට බැරි වුවහොත් තැන්පත් මුදල රාජසන්තක කරනවා පමණක් නොව කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවනගේ නාම ලේඛනයෙහිද ඔහුගේ නම ඇතුළත් කිරීමට ඉඩ තිබේ.

10. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩර්යක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීම හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් භාර ගැනීමේ අයිතිය ගාල්ලේ ඉඩම් සංවර්ධන නිළධාරි සතුයි.

එච්. පී. ඇල්. ප්‍රනාන්දු,
ඉඩම් සංවර්ධන නිළධාරී,
ගාල්ල.

1969 ඔක්තෝබර් මස 6 දා,

10-691—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1969-70 වර්ෂයේ ප්‍රථම භාගය සඳහා අනුරාධපුර ව්‍යාපාරයේ දේවහුව අංශයට ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැපයීම

අනුරාධපුර ව්‍යාපාරයේ මාතලේ දිස්ත්‍රික්කයට අයත් දේවහුව කායඊාංශය සඳහා ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැප්යීමට, අනුරාධපුර ඉඩම් සංවර්ධන නිළධාරි විසින් 1969 ඔක්තෝබර් මස 27 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**අවශ්‍ය ප්‍රාදේශීය ද්‍රව්‍ය**

(1) ඉරු දෙකේ පොල් අතු (දිග අඩි 7 ක් හා පළල අඟල් 18කට නොඅඩු 1000 බැගින්),

(2) දිය ගසන ලද හුණු බුසල් වලින් (රා. 44 කට නොඅඩු බරක් ඇති),

(3) තම්බාපු හුණු බුසලක් සඳහා,

(4) කලුගල් 6×9 කියුබ් වලින්,

(5) කැටගල් කියුබ්වලින් (2", 1 ½", 1", ¾" සහ ½")

(6) පිළිස්සූ ගඩොල් (8 ¾"×4½"×2¾" යන ප්‍රමාණයේ 1000 බැගින්),

(7) ගංගා වැලි කියුබ් වලින්,

සැපයීම සඳහා මිළ ගණන් වෙන් වෙන්ව දැක්විය යුතුයි.

(අ) වත්තේදී/ෆෝරණුවේදී/ගල්වලේදී (සැතපුම් 5 ක් ඇතුළත ලොරි යාහැකි ස්ථානයක් විය යුතුයි.

(ආ) කොන්ත්‍රාත්කරුගේ වාහනයෙන් කායඊස්ථානයට සැපයීමට.

මුදලින් රු. 50 ක් මෙම කායඊාලයේ තැන්පත් කිරීමෙන් හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් හෝ අනුමත කරන ලද ටෙන්ඩර් ෆෝර්ම මෙම කායඊාලයයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ෆෝර්ම නිකුත්කරනු ලබන්නේ 1969 ඔක්තෝබර් මස 27 වැනි දින පෙරවරු 10.30 දක්වා පමණී.

මෙම කායඊාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් ෆෝර්මවල ඉල්ලුම් කල යුතු අතර ඒවා ලිපි කවරයක බහා සීල් තබා 1969 ඔක්තෝබර් මස 27 වැනි දින දවල් 12 ට පෙර මෙම කායඊාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ "ඉඩම් සංවර්ධන නිලධාරි, අනුරාධපුර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ කළ හැකිය. ටෙන්ඩර් බහා එවනු ලබන කවරයේ වම් පස උඩ කෙලවරේ "දේවහුව අංශයට ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

1969 ඔක්තෝබර් මස 27 වැනි දින සවස 2.30 ට අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි විසින් ඉඩම් සංවර්ධන කායඊාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ඇත. එම අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට පැමිණ සිටිය හැක.

පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් ඒ බව දන්වා සතියක් ඇතුළත අනුරාධපුරයේ ඉඩම් සංවර්ධන නිලධාරි සමග පොරොන්දුවකට බැඳිය යුතු අතර, ඔහු විසින් කරනු ලබන ඇනවුම් වලට අනුව දන්වන දිනයේ සිට සති දෙකක් ඇතුළත උපකරණ සැපයීමට හැකිවිය යුතුයි. මෙම කාලය ඇතුළත පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ ද්‍රව්‍ය සැපයීමට අපොහොසත්වන ටෙන්ඩර්කරුවන්ගේ නම් කොන්දේසි කඩ කළ ටෙන්ඩර්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් කිරීමට සිදුවන අතර තැන්පත් මුදලද රජය සතු කිරීමට ඉඩ තිබේ.

තවද, වැඩිපුර විස්තර අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් ලබාගත හැකිය.

එන්. බී. එස්. භාරතී,
ඉඩම් සංවර්ධන නිලධාරි,
අනුරාධපුරය.

1969 ක්වූ ඔක්තෝබර් මස 6 වැනි දින,
අනුරාධපුර ඉඩම් සංවර්ධන කායඊාලයේදීය.

10-652—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### කිළිනොච්චිය රජයේ ගොවිපළට ගල් කැලි (සක්ක ගල්) කියුබ් 12ක් හා අඟල් ½ කළුගල් (මෙටල්) සැපයීම හා ගෙනවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත් කැඳවීමයි

යාපනයේ කෘෂිකම් කාර්යාලයේ කෘෂිකම් නිළධාරි (ගො.පා.භා.නි) විසින් කිළිනොච්චිය රජයේ ගොවිපලට ගල් කැලි (සක්කගල්) කියුබ් 12 ක් හා අඟල් ½ යේ කළුගල් (මෙටල්) පහත සඳහන් නියම යන් අනුව සැපයීම හා ගෙනවිත් භාරදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969 නොවැම්බර් මස 6 වෙනි දින පෙ. ව. 10.00 දක්වා භාර ගනු ලැබේ.

(1) අත් තිවාරම් දැමීමට ගැනීම සඳහා විෂ්කම්භය අඟල් 6කට නොඅඩු ගල් කැලි (සක්ක ගල්) කියුබ් 12 යි.

(2) අඟල් ½ යේ කළුගල් (මෙටල්) (කඩනලද) කියුබ් 1 යි.

ටෙන්ඩර්කරු 1969 නොවැම්බර් මස ජළමුවෙනි සතිය තුළ සියළුම සැපයීම් හා ගෙනවිත් භාරදීම් නිමකළ යුතුය. මෙම ගල් කිළිනොච්චිය රජයේ ගොවිපලට ගෙනවිත් භාරදිය යුතුය.

2. ඉහත සඳහන් එක් එක් ස්ථානයේ එකී සේවාවන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර එකී එක් එක් ටෙන්ඩර් පත්‍රය උදෙසා රුපියල් 10 බැගින් ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ යුතු වේ.

3. යාපනයේ කෘෂිකම් කාර්යාලයේ කෘෂිකම් නිළධාරි (ගො.පා.භා.නි.) ගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර දෙපිටපතකින් අත්සන් තබා මුද්‍රා තබන ලද කවරවල බහා එවිය යුතුයි. කවරයේ ඉහළ වම් කෙළවරේ (ස්ථානයේ නම සහ සේවාව සඳහන් කරන්න) සඳහා ටෙන්ඩර් පත්‍රයයි, යනුවෙන් සඳහන් කොට යාපනයේ කෘෂිකම් කාර්යාලයේ කෘෂිකම් නිළධාරි (ගො.පා.භා.නි.) වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් සීල් තබන ලද කවරවල බහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් යාපනයේ කෘෂිකම් නිළධාරි කාර්යාලයේ (ගො.පා.භා.නි.) ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කළ පසු ලියාපදිංචිකළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍රිකා එවන ලද ටෙන්ඩර් කරුවන් වෙත එම පත්‍රිකා ලැබුණු බව දන්වා එවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් සඳහන් දින සිට දින හතරක් ඇතුළත ටෙන්ඩර් පත්‍රය ලැබුණු බවට එවැනි ලිපියක් කිසියම් ටෙන්ඩර්කරුවෙකුට නොලැබුණි නම්, ඔහු විසින් යාපනයේ කෘෂිකම් නිළධාරි (ගො.පා.භා.නි.) වෙත ඒ බව නොපමාව දැන්විය යුතුයි .

4. ටෙන්ඩරයකට රුපියල් 10 බැගින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම තැන්පත් මුදල් කැමති කච්චේරියක හෝ පේරාදෙනියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ මූලස්ථානයේ හෝ තැන්පත් කළ හැකිය. ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රය පිළිගන්නා ලද බව දැන්වූ දින සිට දින දහයක් ඇතුළත ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමටද හේතුවේ. එහෙත් එයින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදලක් ඇතොත් එය අයකර ගැනීම් වලට බාධාවක් ඇති නොවේ. ගොවිපල කළමනාකරු විසින් නියම කරන ලද දිනයක වැඩ ආරම්භ කර, අදාල දිනයට වැඩය නිමකර දිය යුතුයි. එසේ නොකරන්නාවූ ටෙන්ඩර් කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි සඳහන්වන අලාභය ගෙවීමටද සිදුවේ.

5. ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරණ විට පැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් ඉහතින් දක්වා ඇති දින එකී වේලාවට යාපනයේ කෘෂිකම් නිළධාරි (ගො.පා.භා.නි.) තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් ෆෝර්මයෙහි (දෙපිටපතකින් යුතුව) ඉදිරිපත් නොකරන ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට සම්පූර්ණයෙන්ම එකඟ නොවන්නාවූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මිල ගණන් තීන්තෙන් පැහැදිළි ලෙස සටහන් කළ යුතු අතර, සියළුම වෙනස් කිරීම් වලට ටෙන්ඩර් කරුගේ අත්සන යොදා සහතික කළයුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම් සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිළි අකුරින් සටහන් කර තිබිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරන ලදුව පිළිගනුලැබූවාවූ වැඩ කොටස්වල මුලු වටිනාකමින් සියයට 5ක මුදලක් කෘෂිකම් අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට සිදු සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටුකළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයෙහි එම ටෙන්ඩර්කරුගේ නමද ඇතුළත් කරනවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට අලවන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ.

10. අසතුටුදායක වැඩකටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතියද කෘෂිකම් අධ්‍යක්ෂවරයා සතු වන්නේය. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුගේ වියදමින් එම වැඩ සම්පූර්ණකර ගැනීම සඳහා වෙනත් විධි විධාන යොදා ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ, ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

12. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින සිට සති තුනක් තුළ භාරගැනීම සඳහා තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර්කරුවන්ට සිදුවේ.

13. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකගවෙන අතර ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අයගෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු විමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිතව ලියවිච් ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකගත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියකු බව අදහස් කෙරෙන අතර, ඒවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාසයකටම සාධාරණවූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාතීමේන්තුවේ ඕනෑම නිළධාරියෙකුට ඒවා පරීක්ෂාකර බැලීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයකට තැපෑලෙන් යැව්වහොත් හෝ ඕහු අතටම භාර දුන්නා සේ සළකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥාපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීමට අහිතකර යයි රජය සලකනු ලබන විටක හා කිසියම් සේවකයකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

17. තනි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමත් සමග රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි නම් සඳහන් කිසිවෙකු සමග හෝ නාමට සැහේයයි හැඟී යන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැදෙනු නොලැබේ.

18. එකී එකී ගොවිපලවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්)

පේරාදෙණියේදීය.
69. 10. 4.

10-596

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කුණ්ඩසාලේ, කෘෂිකම් විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍යය විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969.11.6 වෙනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

**වී බුසල් 267 කි.**

2. කුණ්ඩසාලේ, කෘෂිකම් විද්‍යාලයීය කාර්යාලයෙන් ටෙන්ඩර් අය දුම් පත් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයෙහි (පෝර්ම) ඔබගේ වැඩිම මිළ ගණන සඳහන් කර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා මුද්‍රා කර "වී මිළට ගැනීම" යන්න ලියුම් කවරයේ වම් කෙළවරේ සඳහන් කර සභාපති, කුණ්ඩසාලේ කෘෂිකම් විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකම් විද්‍යාලය, කුණ්ඩසාලේ යන ලිපිනයට ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුයි.

3. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසාන දින දහවල් 12 වන තුරු ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. එම නිකුත් කිරීම කරනු යේ, එක් ටෙන්ඩර් පෝර්මයක් වෙනුවෙන් රු. 50 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ කළ හැක.

4. ටෙන්ඩර් කරුවන්ට උවමනානම් ඔවුන්ට හෝ ඔවුන් වෙනුවෙන් එක් එක් නියෝජිතයෙකුට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී එනම්, 1969.11.6 වෙනි දින පස්වරු 2.30 ට ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත ඉහතකී දිනයේදී ඉහතකී වේලාවට කුණ්ඩසාලේ, කෘෂිකම් විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව දින 14 ක් තුළදී දන්වනු ලැබේ.

5. කොන්දේසි නොමැතිවන අතර ටෙන්ඩර් ස්ථිර විය යුතුයි. ටෙන්ඩර් පත් එවීමට අදහස් කරන්නවුන්ට කුණ්ඩසාලේ, ගොවිපලේ කළමනාකරු හමුවී කාර්යාල වේලාවන් තුළ සඳහන් වී තොගය පරීක්ෂා කළ හැක.

6. තෝරා ගත් ටෙන්ඩර්කරු විසින් ඒ බව ඔහුට දන්වා දස දිනක් තුළ එහි සඳහන් මුලු මුදල ගෙවිය යුතුය. මුදල ගෙවා දින දහහතරක් තුළ එම බඩු ගෙන යා යුතුයි. ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යැවීමෙන් හෝ එහි සඳහන් ස්ථානයේ තැබීමෙන් හෝ ටෙන්ඩරය භාර ගත් බව ඔහුට දැන්වූවා සේ සලකනවා ඇත. කුණ්ඩසාලේ, කෘෂිකම් විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වෙන අන්දමකට තීරණය නොකළ නොකලහොත් නියමිත කාලසීමාව තුළදී ගෙන නොයෙස් ගබඩාවේ ඉතිරිවෙන බඩු නැවත විකුණා දැමීම හෝ වෙනත් සුදුස්සක් කිරීමට හෝ ඉඩ තිබේ. එවිට ටෙන්ඩර් කරුවන්ට ඒවා ගැන කිසිම අයිතිවාසිකමක් ඉදිරිපත් කළ නොහැක.

7. (අ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ටෙන්ඩරය අස්කරගන්නා බව නොදැන්වුවහොත් හෝ (ආ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ඒවා නොඑවුවහොත් හෝ (ඇ) ටෙන්ඩරය තෝරාගත් බව දැන්වීමෙන් පසුව නියමිත කාලසීමාව තුළදී මුදල නොගෙවා හෝ බඩු ඉවත් නොකර හෝ හැරියහොත්, තැන්පත් මුදල රාජසන්තක කරනවා ඇත.

8. තෝරාගත් ටෙන්ඩර් කරුවෙකු බඩු ගෙනයාම ප්‍රතික්ෂේප කළහොත් හෝ ගෙන යාමට බැරිවුවහොත් හෝ තැන්පත් මුදල රාජසන්තක කරනු හැර, කොන්දේසි කඩකරන කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයේ ඔහුගේ නම ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

9. කිසිම හේතුවක් නොදන්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කුණ්ඩසාලේ, කෘෂිකම් විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ඇත.

ජී. වී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකම් අධ්‍යක්ෂ,
(කෘෂිකම් අධ්‍යාපන හා ගොවිපලවල්).

1969. 10 4 වෙනි දින,
පේරාදෙණියේ, කෘෂිකම් දෙපාර්තමේන්තුවේදීය.

10–547—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් දැන්වීම

## ගොවිජන සේවා දෙපාතීමේන්තුව

### මඩකලපු දිස්ත්‍රික්කයේ නි. මි. යෝ. ක්‍ර. ගබඩා ඉදිකිරීම සඳහා ටෙන්ඩර්—කොක්කඩිචෝලයි සහ වව්නතිව්

මඩකලපු දිස්ත්‍රික්කයේ පහත සඳහන් නි. මි. යෝ. ක්‍ර. ගබඩා ඉදිකිරීම සඳහා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 නොවැම්බර් 14 වැනි සිකුරාදා ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

කොක්කඩිචෝලයි—ගොඩනැගිලි එකයි (1)

වව්නතිව්—ගොඩනැගිලි එකයි (1)

2. රු. 250 ක් (රුපියල් දෙසිය පණහක්) තැන්පත් කර කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරන ස්ථානයේ ගොවිජන සේවා දෙපාතීමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක. මෙම ඇප එක් එක් ගොඩනැගිල්ල සඳහා වේ.

3. රු. 30,000 කට හෝ ඊට වැඩි ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ රජයේ බලය ලත් කොන්ත්‍රාත් කරුවනට පමණක් "කොන්ත්‍රාත් කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1966 නොවැම්බර් මස 13 වැනි දින දවල් 12.00 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැක. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන අය විසින් ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන දින නියමිත වේලාවට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි කල් වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මවතේ අංක 42 දරන ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් /වෙනුවට.

1969 ඔක්තෝම්බර් 17 වැනි දින,
කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාතීමේන්තුවේ දී ය.

10–599/1—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාතීමේන්තුව

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාන් කුලම්හි නි. මි. යෝ. ක්‍ර. ගබඩා තැනීම සඳහා ටෙන්ඩර්

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාන්කුලම්හි නි. මි. යෝ. ක්‍ර. ගබඩා තැනීම සඳහා 1969 නොවැම්බර් මස 14 වෙනි සිකුරාදා ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. රුපියල් 250 ක් තැන්පත් කර ඒ සඳහා ලබා ගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරන ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ, අංක 60, දරන ස්ථානයේ ගණකාධිකාරීට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් 30,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත් කරුවන්ට පමණක් "කොන් කොන්ත්‍රාත් කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 නොවැම්බර් මස 13 වෙනි දින දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත්කරනු ලැබේ. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල් වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරන ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් /වෙනුවට.

1969 ඔක්තෝම්බර් මස 17 වෙනි දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාතීමේන්තුවේ දී ය.

01–599/2—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

### දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

දේශීය ආදායම් කොමසාරිස්ට අයත් මෙහි උපලේඛනයෙහි විස්තර වශයෙන් දක්වා ඇති ස්ථාන මිලදී ගැනීම සඳහා කොළඹ 1, සෙනේට් චතුරශ්‍රයේ නවලෝකම් කායසීලයේ දේශීය ආදායම් සහකාර කොමසාරිස් (අය සේවා නොවන) විසින් 1969 ඔක්තෝබර් මස 30 වැනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. එකී ස්ථාන මිලදී ගැනීම සඳහා පිරිනමනු ලබන ගණන දක්ව මින් ඹිනැම අයුරකින් පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍රයන් ඉදිරිපත් කළ හැක.

3. 1969 ඔක්තෝබර් 31 වැනි දින ප. ව. 2.30ට එකී සහකාර කොමසාරිස්ගේ කායසීලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර කරුවන්ට එහි පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

5. සාර්ථක ටෙන්ඩර්කරුගේ පිරිනැමීම එකී සහකාර කොමසාරිස් විසින් භාර ගත් වහාම එම ටෙන්ඩර්කරු විසින් පිළිගනු ලැබ ටෙන්ඩරයේ වටිනාකමින් දහයෙන් එකකට සමාන මුදලක් මුදලින් තැන්පත් කළයුතු අතර, ඉතිරි මුදල 1969 නොවැම්බර් 15වැනි දින ප. ව. 2.30 පෙර ගෙවිය යුතුය.

6. 1969 නොවැම්බර් 15 වැනි දින ප. ව. 2.30 වන විට ඉතිරි විකුණුම් මිළ නොගෙවතොත් 1969 ඔක්තෝබර් 31 වැනි දින තැන්පත් කළ මුදල ආදායමට රාජසන්තක කරනු ලැබේ.

7. කිසියම් ටෙන්ඩරයක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය එකී සහකාර කොමසාරිස් විසින් තමා වෙතම තබා ගනු ලැබේ.

8. එකී මිලට ගැනීම සම්පූර්ණ කර, මුළු විකුණුම් මිළ ගෙවීමෙන් පසු දේශීය ආදායම් කොමසාරිස් විසින් එකී ගැනුම්කරුට එකී ගැනුම්කරුගේ පිරිවැයට සහ අයකිරීම්වලට වලංගු සහ බලැති ඔප්පු මගින් එකී ස්ථාන පවරා දෙනු ලැබේ.

9. මෙම ස්ථානයේ දැනට බදුකරුවෙකු පදිංචිවී සිටින අතර ඔහු අස්කර එම ස්ථානය සාර්ථක ගැනුම්කරුට භාරදීමට දේශීය ආදායම් කොමසාරිස් භාර නොගනී.

10. තැපැලෙන් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කවරයේ උඩ වම්පස "ටෙන්ඩරය" යන්න සඳහන් කර දේශීය ආදායම් සහකාර කොමසාරිස් (අය සේවා නොවන) නවලෝකම් කායසීලය, සෙනේට් චතුරශ්‍රය, කොළඹ 1 යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

ඊ. එම්. පී. තිලකරත්න,
අත්සන් කළේ,
දේශීය ආදායම් සහකාර කොමසාරිස්,
(අය සේවා නොවන)

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ,
3වෙනි මහල, නවලෝකම් කායසීලය,
සෙනේට් චතුරශ්‍රය,
කොළඹ 1.

#### ඉහතකී උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සහ කොළඹ නාගරික සභා සීමාව තුළ, කොටහේනේ ලැස්කොරින් වීදියේ පිහිටි, උතුරින් අංක 2890 දරන සැලැස්මෙහි අංක 35 දරන බිම් කැබෙල්ලෙන්ද; නැගෙනහිරින් එකී අංක 2890 දරන සැලැස්මෙහි අංක 51 දරන බිම් කැබැල්ල යනුවෙන් සලකුණු කර ඇති අඩි 40 පළල පාරක් සඳහා වෙන්කර තබා ඇති කොටසින්ද, දකුණින් එකී අංක 2890 දරන සැලැස්මෙහි අංක 49 දරන ඉඩම් කැබෙල්ලෙන්ද, බටහිරින් එකී අංක 2890 දරන සැලැස්මෙහි අංක 49 දරන ඉඩම් කැබෙල්ල යනුනේ සලකුණු කර ඇති දකුණු ස්කිනර් පාරට වැටෙන අඩි 40 පළල පාරක් සඳහා වෙන්කර තබා ඇති කොටසට විහිදී යන අඩි 30 පළල පාරක් සඳහා වූ වෙන්කර තබා ඇති කොටසින්ද මායිම්වූ එච්. දොන් ඩේවිඩ් බලයලත් මිනින්දෝරු සහ මට්ටම්කරු විසින් සකස් කරන ලද අංක 2890 සහ 1969 ජූනි මස 1 දින හා 2 දින දරන සැලැස්මේ අංක 34 දරන බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර ඇති ඉඩමද, එහි පිහිටි ගොඩනැගිලි සහ ගහකොළද වරිපනම් අංක 49 දරන ස්ථානයද යන මේ පර්චස් දොළහයි දශම හතයි තුනක (අ 0, රූ. 0, පර්. 12.73.) ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එකී සැලැස්මේ අංක 51 යනුවෙන් සලකුණු කර ඇති අඩි 40 පළල පාර සඳහා වෙන්කර තබා ඇති කොටස සහ එකී සැලැස්මේ ඉඩම් කැබැල්ල 40 යනුවෙන් සලකුණු කර ඇති දකුණු ස්කිනර් පාරට වැටෙන අඩි 40 පළල පාරක් සඳහා වූ වෙන්කර ඇති කොටසට විහිදී යන අඩි 30 පළල පාරක් සඳහා වෙන්කර ඇති කොටසද උඩින් යාමට සම්පූර්ණ නිර්බාධිත සහ පරම නිදහසද, මාර්ග අයිතිය සහ ප්‍රවේශයද වේ.

01–558—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව—ටෙන්ඩර් දැන්වීමයි

### ඉන්ටර් නැෂනල් වාහනයන්හි අමතර කොටස් විකිණීමයි

1. ඉන්ටර් නැෂනල් වාහනයන්හි අමතර කොටස් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1969 ක්වූ නොවැම්බර් මස 17 වන සඳුදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ පාසැල් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබා ගත් ටෙන්ඩර් පෝර්මවලයි. වර්ෂ 1969 ක්වූ නොවැම්බර් මස 13 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1969 ක්වූ නොවැම්බර් මස 17 වන සඳුදා පූ. භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකරු.

තැ. පෙ. 540,
කොළඹ,
1969 ක්වූ ඔක්තෝබර් මස 17 වෙනි දින දීය.

8–541—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීමයි

වාලච්චෙනෙයි නැගෙනහිර කඩදාසි කම්හලට ඇලුමිනියම් සල්ෆේට් දිග ටොන් 600 ක් (දිග ටොන් 1 = රු. 2240) සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවේ.

69.12.20 දින පස්වරු 2 ටෙන්ඩර් බාරගැන්ම අවසන් කෙරේ. මූලිකයන්ගේ/සැපයුම්කරුවන්ගේ නම් හා ලිපිනයන් අඩංගුකර අයැදිවිට ටෙන්ඩර් ආකෘතිපත් හා අනිකුත් විස්තර ලබාගත හැක.

තී. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යුනියන් පෙදෙස,
කොළඹ 2. 24.9 69.

8–586—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් පොල්ගහවෙල නව දුම්රිය ස්ථාන ගොඩනැගිල්ල විරුද්ධ දෙසින් පිහිටි මාර්ග හා රථවාහන නවත්වන ප්‍රදේශය පසින් පිරවීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැකිය.

2. කොළඹ, ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ පිළිබඳ අංශයේ ප්‍රධාන ඉංජිනේරුතැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණ කොට, අනුපිටපතක්ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරී තැනගෙන් ලබාගත හැකිය. සැලැස් මවුල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. 1969 ඔක්තෝබර් මස 30 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 25,000 කට නො අඩු ගණනකට ලියාපදිංචි වූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක්ද තැන්පත්කර ලබා ගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1969 ඔක්තෝබර් මස 6 දින,
කොළඹදීය.
(තැ. පෙ. 370)

8–684—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට සීලිං විදුලි පංකා 207 ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩලය සභාපති විසින් (ලිපිනය: දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10) 1969 නොවැම්බර් 18 වැනි අඟහරුවාදා පෙ. ව. 11 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර, අවශ්‍ය වුවහොත් ටෙන්ඩර් කරුවන් විසින් ඉහත සඳහන් සේවා භාරගැනීමට සහ සතුටුදායක ලෙස ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වයේ ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාලවන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. කොළඹ 10 හි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

4. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 250 ක් කොළඹ 10 හි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක හෝ තැන්පත්කර, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969 නොවැම්බර් මස 17 වැනි සඳුදා දහවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුා කරනු ලැබේ.

5. 1969 නොවැම්ර් මස 1ට අඟහරුවාදා පෙ. ව. 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනීසිටීමට අවසර ඇත.

6. වැඩි මනත් විස්තර අවශ්‍ය නම් දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැක.

දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.
ඇම්. සරීන්,

කොළඹ,
1969.10.17 වැනි දින.

8–597—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට විදුලි පණිවුඩ සහ දුරකතන කම්බි අලුත්වැඩියා කිරීම සඳහා උපකරණ (මැටීරියල්ස් ෆෝ රිනුවල් ඔෆ් ටෙලිග්‍රාෆ් ඇන්ඩ් ටෙලිෆෝන් කේබල්ස්) සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ 10, දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 දෙසැම්බර් මස 18 වැනි දින පෙරවරු 11 තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාරගැනීමට හා හරියාකාරව ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව, අවශ්‍ය වුවහොත්, ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුය.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරීතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීතැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969 දෙසැම්බර් මස 17 වෙනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1969 දෙසැම්බර් මස 18 වෙනි දින පෙරවරු 11.05 ට දුම්රිය දෙපාර්තමේන්තු මූලස්ථානයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරීතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1969. 10. 17 දින,
කොළඹ.

8–690—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

රත්මලානේ දුම්රිය කර්මාන්ත ශාලාවේ ගොඩගසා තිබෙන දර මිළයට ගෙන ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය: දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10) 1969 නොවැම්බර් මස 18 වෙනි අඟහරුවාදා තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර, අවශ්‍ය වුවහොත් ටෙන්ඩර් කරුවන් විසින් ඉහත සඳහන් සේවා භාර ගැනීමට සහ සටුදායක ලෙස ඉඩු කිරීමට තමාගේ මුදල් තත්වය ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාලවන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. කොළඹ 10හි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

4. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100 ක් කොළඹ 10හි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1969 නොවැම්බර් 17 වෙනි සඳුදා දහවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. 1969 නොවැම්බර් මස 18 වෙනි අඟහරුවාදා පෙ. ව. 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩිමනත් විස්තර අවශ්‍ය නම්, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබගාත හැකිය.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1969. 10. 6 වෙනි දින,
කොළඹ.

8–658—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### රබර් මුද්‍රා සැපයීම

රබර් මුද්‍රා සැපයීම සඳහා කොළඹ, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1969 නොවැම්බර් මස 4 වැනි දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

(2) 1969 නොවැම්බර් 4 වැනි දින පෙරවරු 10.15ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

(3) කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

(4) කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරන කවුළුවේ රු. 50ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගෙන, එම රිසිට් පත ඉදිරිපත් කළ විට, අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. 1969 ඔක්තෝබර් මස 19 දින සිට 1969 නොවැම්බර් 2 දින සවස 4.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

(5) වැඩි විස්තර, කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් ලබා ගත හැක.

වී. එම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ
අධ්‍යක්‍ෂ.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

10–573—69.8.8 දින අංක 14,866 දරන් ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව
## තැපැල් ගෙනයාම—ඉරනතිව්පල්ලවරායන්කට්ටු

යාන්ත්‍රික මෝටර් බෝට්ටු මගින් 1969 දෙසැම්බර් 1 වෙනි දින සිට දෙවසක් තුළ ඉරනයිතිවු සහ පල්ලවරායන්කට්ටු උප තැපැල් කාර්යාලයන් අතර, සතියකට තෙදිනක්, එක් අතකට එක තැපැල් වාරයක් බැගින් පැවැත්වීමේ කොන්ත්‍රාත්තුව සඳහා එවනු ලබන ටෙන්ඩර්, කොළඹ 1, ඩියුක් විදිය, තැපැල් හා තැපැල් විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, තැපැල් හා විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969.11.12 වැනි දින පෙ. ව. 10.30 වන තෙක් භාර ගනු ලැබේ.

පෝස්ට්මාස්ටර් ජනරාල් තැනගෙන් ඉල්ලුම් කොට ලබාගත් ආකෘති පත්‍ර වල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. මීට අදාල සියලු විස්තර ද ඔහුගෙන් ලබාගත හැක. රුපියල් 10ක් ගෙවා තැපැල් කාර්යාලයකින් හෝ කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනුයේ 1969.10.30 දින දවල් 12 වන තෙක් පමණි.

වී. ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ
අධ්‍යක්ෂ.

තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
ඩියුක් වීදිය,
කොළඹ 1.

10–545—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## මාතර කච්චේරිය

### 4 ශ්‍රී 7150 දරන අබලන් ලෑන්ඩ් රෝවර් රථය විකිණීම

දැනට මාතර කච්චේරි භූමියෙහි තිබෙන ඉහත සඳහන් අබලන් ලෑන්ඩ් රෝවර් රථය විකිණීම සඳහා, 1969 නොවැම්බර් මස 6 වැනි දින පෙ. ව. 10 තෙක්, මාතර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් සීල් තබා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නතර කළ විගස එදිනම ටෙන්ඩර් පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට පැමිණ සිටීමට ඉඩ දෙනු ඇත.

රු. 100ක මුදලක් මාතර දිසාපති වෙත තැන්පත් කළ පසු, මේ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. 1969 නොවැම්බර් මස 5 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ඇත. ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කච්චේරිය, මාතර යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් පුද්ගලිකව පැමිණ මාතර කච්චේරියේ කාර්යාල සහකාර තැනට භාර දීය යුතුය. ටෙන්ඩර් පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහල කෙළවරෙහි "4 ශ්‍රී 7150 සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

වැඩ කරන ඕනෑම දිනක කාර්යාලීය වේලාවන් තුළදී මාතර දිසාපති තුමාගේ අවසරය පිට රථය කච්චේරි භූමියේදී පරීක්ෂා කර බැලිය හැකිය.

ටෙන්ඩරය භාර ගත් බවට දැනුම් දුන් දින සිට සතියක් ඇතුළතදී සාර්ථක ටෙන්ඩර්කරු විසින් තමා ටෙන්ඩර් කළ මුළු මුදල සම්පූර්ණයෙන්ම ගෙවා රථය කච්චේරි භූමියෙන් ඉවත් කරගත යුතුය.

ඉදිරිපත් කරනු ලබන කිසියම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මාතර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතු වන්නේ ය.

වැඩිදුර විස්තර සඳහා මාතර කච්චේරියෙන් විමසන්න.

ඩබ්ලිව්. ගජමන්ගේ,
මාතර දිසාපති වෙනුවට ය.

1969. 10. 4 වැනි දින,
මාතර කච්චේරියේ දීය.

10–539—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

1969 දෙසැම්බර් මස 11 වැනි දින සිට 1970 දෙසැම්බර් 31 වැනි දක්වා කාලය තුළ පහත දැක්වෙන උපලේඛනයේ අන්දමට සුළු ආහාරයක් සමග කිරි තේ සැපයීම හා බෙදා හැරීම සඳහා ටෙන්ඩර් මෙයින් කැඳවනු ලැබේ.

(අ) සමාන්‍යයෙන සැතපුම් 6 ක් ආවරණය වන එලිසබෙත් රැජින පාලමේ සිට විජය පාලම දක්වා වරාය පෙදෙස තුළ ස්ථාන 8 ක සේවක මහතුන් 35 දෙනෙකුට පමණ පස්වරු 5.00 ට,

(ආ) වරාය පෙදෙස සිට සාමාන්‍යයෙන් සැතපුම් 6 ක් ආවරණය වන මැක්ලම් ගේට්ටුව සහ කොලොන්නාව සේවක මහතුන් 14 දෙනෙකුට පමණ පස්වරු 5.00 ට,

(ඇ) සාමාන්‍යයෙන් සැතපුම් 10 ක් ආවරණය වන වරාය පෙදෙස තුළ ස්ථාන 50 ක සේවක මහතුන් 200 කට පමණ, මධ්‍ය රාත්‍රි 12.00 ට,

(ඇ) සාමාන්‍යයෙන් සැතපුම් 10 ක් ආවරණය වන බ්ලූමැන්ඩල්, මෝදර, නාගලම් වීදිය, ග්‍රෑන්ඩ්පාස්, ඌරුගොඩවත්ත, කොලොන්නාව සහ මීතොටමුල්ල සේවක මහතුන් 34 දෙනෙකුට පමණ මධ්‍යම රාත්‍රි 12.00 ට,

(ඉ) සාමාන්‍යයෙන් සැතමුම් 3 ක ආවරණය වන වින්සන්ට් වීදිය, ශාන්ත සෙබෙස්තියන් දොරටුව, මැක්ලම් පාර හරහා මරදාන සේවක මහතුන් 15 ට පමණ මධ්‍ය රාත්‍රි 12.00 ට,

2. සුළු ආහාරයක් හා කිරි තේ එකක අනුමත කරන ලද මුදල ශත 40 කි.

3. දිනපතා සැපයීමට අදහස් කරන සුළු ආහාරයන් මොනවාද යන්න වර්ග කර ටෙන්ඩර්කරුවන් විසින් දැන්විය යුතුය.

**සටහන :** බෙදාහැරීමේ ස්ථානයන් හා ආහාර වේල් ගණන කලින් කලට වෙනස්වීමට ඉඩ ඇති අතර සපයන ලද මුළු ආහාර වේල් වෙනුවෙන් ගෙවීම් කරනු ලැබේ.

4. බෙදා හැරීමේ ස්ථානයන් පරීක්ෂාකර බැලීමට ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය නම් මේ සඳහා කොළඹ වරාය කොමිෂන් සභාවේ පාලක ලේකම් කායර්‍යාලයට පැමිණෙන්න.

5. ටෙන්ඩර් බාරගන්නා අන්තිම දිනය 1969 නොවැම්බර් 3 වන දින දහවල් 12 දක්වාය.

6. "තේ ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කර සීල් තබන ලද ටෙන්ඩර් ලේඛනගත තැපෑලෙන් වරාය කොමසාරිස් වෙත එවිය යුතුය. එසේ නැතිනම් කොළඹ වරාය කොෂන් සභාවේ අධිකාරි සිවිල් ඉංජිනේරු (ඇම්) තැනගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් පත්‍රය දැමිය යුතුය.

වී. සී. ප්‍රනාන්දු,
වරාය කොමසාරිස් වෙනුවට.

වරාය කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ 1,
1969 ඔක්තෝබර් මස 7 දින.

10–643—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි දිස්ත්‍රික් පාලන ගොඩනැගිලි නඩත්තු කිරීම, වැඩි දියුණු කිරීම හා එකතු කිරීම

1970 සැප්තැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා ඉහත සඳහන් ශීර්ෂය යටතේ කළයුතු වැඩ කරදීමට ඉදිරිපත් වන අයගේ ටැන්ඩර් පත්‍ර, මුදලින් රු. 25,000 කට අධික කොන්ත්‍රාත් වැඩ සඳහා ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් 1969 නොවැම්බර් මස 2 වන දින පෙරවරු 12 දක්වා, රත්නපුර දිසාපති තැන විසින් භාරගනු ලැබේ.

2. මේ සම්බන්ධයෙන්වූ ටෙන්ඩර් පත්‍ර 1969 ඔක්තෝබර් 31 වන දින පස්වරු 4.30 දක්වා, රත්නපුර දිසපති කායර්‍යාලයෙන් ලබාගත හැකිය. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීම සඳහා කල්තබා රු. 25 ක මුදලක්, රත්නපුර දිසාපති කායර්‍යාලයේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුවේ.

3. ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙ,' ඉහල වම් කෙළවරේ, "රත්නපුර දිස්ත්‍රික් පාලන ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම" යන්න, ලියා, රත්නපුර දිසාපති වෙත, ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. නොඑසේ නම්, දිසාපති කායර්‍යාලයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ බහාලිය යුතුවේ.

4. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම. 1969 නොවැම්බර් මස 2 වන දින දවල් 12 ට අවසන් කරනු ලැබේ.

රත්නපුර දිසාපති වෙනුවට.
එක්ස්. ඇම්. සෙල්ලතම්බු,
අතිරේක දිසපති

1969 ඔක්තෝබර් මස 4 වැනි දින,
රත්නපුර කච්චේරියේ දී ය.

10 660—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

# වෙන්දෙසි කිරීම පිළිබඳ දැන්වීම්

### රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ හැමිල්ටන් හැංගර් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 ඔක්තෝබර් මස 30 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 ඔක්තෝබර් මස 28 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මේම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය ඒසී/විකිණීම් 15
1969 ඔක්තෝබර් මස 4 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. පලිදු සහිත හිස් කඩදාසි උර 1,500 යි.
2. මාළු කෑම (අතුගා එකතු කළ) ගෝනි 50 යි.
4. බෝල කඩල (අතුගා එකතු කළ) ගෝනි 65 යි.
5. කොත්තමල්ලි (අතුගා එකතු කළ) ගෝනි 74 යි.

පිටපත් : 1. ප්‍ර.ස.නි.නි. (විකිණීම්).
2. ජෙ, ගො.නි. (හැ. හැ.).

10-679

### රේගුවේ වෙන්දේසියක්

1969 නොවැම්බර් මස 4 වැනි දින පෙ.ව. 10 ට කොළඹ, රේගුවේ පී 3 වෙන්දේසි ගුදමේදී පිත්තල ආලේප කළ වානේ සරනේරු පෙට්ටි විස්සක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 නොවැම්බර් මස 2 වැනි දින පෙ. ව. 10 සිට පෙ. ව. 11.30 දක්වා එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

වෙන්දේසියෙන් මිලයට ගන්නා මෙම බඩු තොගය වෙන්දේසිය අනුමත කර දින හතක් ඇතුළතදී ගෙන නොගිය හොත්, එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල රාජසන්තක වන බවත් සැළකිය යුතු. යි.

සී. එස්. මෙන්ඩිස්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඩීවී/69/39.
1969 ඔක්තෝබර් 7 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

10–664—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## හිමිකම් නොපෑ තැපැල් පැකැට්ටුවල බහා තිබුණු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

අහිමි ලිපි කාර්යාලයට ලැබුණු හිමිකම් නොපෑ තැපැල් භාණ්ඩවල බහා තිබුණු පහත සඳහන් භාණ්ඩ, 1969 ඔක්තෝබර් මස 27 වැනි සඳුදා පස්වරු 1.30 ට, කොළඹ 3, කොල්ලුපිටියේ 19 වැනි පටුමගෙහි අංක 20 දරණ ස්ථානයේ අහිමි ලිපි කාර්යාලයේදී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සාධාරණ ගණනකට ඉල්ලනු නොලබන භාණ්ඩ විකිණීම අත්හිට වනු ලැබේ.

බී. ඩී. ඇම්. ලියනගේ,
පෝස්ට්මාස්ට ර්ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ
වෙනුවට.

පාලන අංශය,
තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1,
1969.10.6

| භාණ්ඩ අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|
| 1. | පරණ පත්තර හොණ්ඩරයක්. |
| 2. | පරණ පත්තර හොණ්ඩරයක්. |
| 3. | එකක් රාත්තල් 40 ක් බැගින් වූ පරණ මුද්‍රිත කඩදාසි මලු 35 ක්. |
| 4. | ඉංග්‍රීසි සඟරා තොගයක්. |
| 5. | —එම— |
| 6. | —එම— |
| 7. | —එම— |
| 8. | —එම— |
| 9. | —එම— |
| 10. | —එම— |
| 11. | —එම— |
| 12. | දෙමළ සඟරා තොගයක්. |
| 13. | ආගමික සඟරා තොගයක්. |
| 14. | වෛද්‍ය සඟරා තොගයක. |
| 15. | ඉංග්‍රීසි පොත් තොගයක්. |
| 16. | පාවිච්චි කළ, මෙරට හා පිටරට තැපැල් මුද්දර 20,000 ක තොගයක්. |
| 17. | ආගමික පින්තූර තොගයක්. |
| 18. | —එම— |
| 19. | ඉන්දියන් කපු සාරි තුනක්. |
| 20. | —එම— |
| 21. | —එම— |
| 22. | ඉන්දියන් කපු සාරි දෙකක්. |
| 23. | පින්තාරු කුඩු පැකට් කිහිපයක් හා සුරුට්ටු පෙට්ටි දෙකක්. |
| 24. | විල්කින්සන් රේසර් තල පැකට්ටු දෙකක්, රතු සලුවක්, ඇස් කණ්නාඩි දෙකක්, පෑනක්, අල් පෙනෙත්ති පැකැට්ටුවක්, මාලයක් සහ පාවිච්චි කළ මුද්දර කාඩ් පතක්. |
| 25. | ගිනි නිවීමට ගන්නා උපකරණ එකක්. |

10–619—69.1.3 දින අංක 14,834 දරන ගැසට් පත්‍රය

### පරණ බඩු වෙන්දේසියයි

මෙහි පහත දැක්වෙන ප්‍රයෝජනයට ගත නොහැකි බඩු සහ පරණ තිල ඇඳුම් කොටස් 69.10.24 දින පෙරවරු 10.00ට කෑගල්ල සහකාර පොලිස් කායභිල භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනනු ලැබේ.

වෙන්දේසියේදී බඩු ගන්නා අයවලුන් එවේලේම මුදල් ගෙවා රිසිට් පතක් ලබා ගැනීමටත එම බඩු වෙනදේසිය අවසන්වූ වහාම ඉවත් කර ගැනීමටත් දැනුම් දෙනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| 1. පාපැදි | ... | ... | ... | 15 |
| 2. පිල්ටර | ... | ... | ... | 1 |
| 3. ස්ත්‍රික්ක | ... | ... | ... | 1 |
| 4. කුනාටු ලාම්පු | ... | ... | ... | 1 |
| 6. මේස ලාම්පු | ... | ... | ... | 1 |
| 7. මිනුම් පටි | ... | ... | ... | 1 |
| 8. කොහු ගුදිරි | ... | ... | ... | 41 |
| 9. කළුසපත්තු ජෝඩු | | ... | ... | 445 |
| 10. කළු වැහිකබා | | ... | ... | 10 |
| 11. කාකි කොට කලිසන් | | ... | ... | 42 |
| 12. කාකි හට කබා | | ... | ... | 36 |
| 13. කාකි කැලැකබා | | ... | ... | 20 |
| 14. ඇලතොප්පි | | ... | ... | 250 |
| 15. බූට්ස් ජෝඩු | | ... | ... | 95 |
| 16. ඇඳුම් කට්ටල් පලස් | | ... | ... | 40 |
| 17. පටි හම් | ... | ... | ... | 42 |
| 18. රබර් වැහිකබා | | ... | ... | 12 |
| 19. ගැලුම් 4 ටින් | ... | ... | ... | 40 |
| 20. ගැලුම් 1 ටින් | ... | ... | ... | 151 |

සහකාර පොලිස් අධිකාරී,
කෑගල්ල.

10–602—69.1.3 දින අංක 14,834 දරන ගැසට් පත්‍රය

---

### රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ චාමස් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 ඔක්තෝබර් මස 28 වෙනි දින පෙ. ව. 10.00 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 ඔක්තෝබර් මස 26 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය: ඒ ඕ විකිණීම් 14
1969 ඔක්තෝබර් මස 1 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

1. පී. වී. සී. කොම්පවුන්ඩ් මිශ්‍ර පාටවලින් යුත් ගෝනි 234 යි.
2. යකඩ කඹ හා නැමුණු යකඩ තොගයක්.
3. පරණ තේක්ක කොට 2 යි.

10–443

---

### රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ ඇලබද ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 නොවැම්බර මස 3 වෙනි දින පෙ. ව. 10.00 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 නොවැම්බර මස 2 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය: ඒ ඕ/විකිණීම්
1969 ඔක්තෝබර මස 16 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. ප්ලාස්ටික් භාජන කාටුන 5 යි.
2. ලාංජනයන් තොග 1 යි.
3. විදුලි පන්දම් කාටුන් 9 යි.
4. මෝටර් ට්‍යුබ් පෙට්ටි 1 යි.
5. චොට්මල් සාරය මලු 5 යි.
6. මගඩි සෝඩා ටොන් 2 යි.
7. අතුගා එකතු කළ කලවම් පොහොර ටොන් 2 යි.

10–697—69.1.3 දන අංක 14,834 දරන ගැසට් පත්‍රය

---

### රේගුවේ දෙපාර්තමේන්තුව

**පරිහරණයට නුසුදුසු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මේස, පුටු, ඇඳන්, කේතල, ටයර් ආදි පරිහරණයට නුසුදුසු භාණ්ඩ යන් 1969 ඔක්තෝබර් මස 30 වෙනි දින පෙරවරු 10.00 සිට කොටුවේ, කොමස.රියට් වීදියේ පිහිටි රේගු දෙපාර්තමේන්තු ලිපි ද්‍රව්‍ය කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ. එදිනට වෙන්දේසියේ විකිණීම අවසන් කිරීමට නොහැකි වුවහොත් පසු දිනද එය පවත්වානවා ඇත. 1969 ඔක්තෝබර් මස 29 වෙනි දින කාර්යාල වේලාව තුළදී මේ භාණ්ඩයන් පරීක්ෂා කර බැලිය හැක.

මෙම වෙන්දේසියේදී මිලයට ගන්නා සෑම භාණ්ඩයකම වටිනාකම වහාම මුදලින් ගෙවා වෙන්දේසි අවසානයේදී ඒවා ඉවත් කර ගත යුතුයි.

වී. සින්නදෝරේ,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට,

අංක එන්ඕ/392
ලිපි ද්‍රව්‍ය කාර්යාලය,
රේගුව, කොළඹ.
1969. 10. 8.

10–69669.1.3 දින අංක 14,834 දරන ගැසට් පත්‍රය

---

### පරණ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පාවිච්චි කරනලද හම් සපත්තු, හම් බූට් සපත්තු, හම් පටි, කාකි වැහි කබා හා ඇළ තොප්පි ඇතුලු පරණ භාණ්ඩ රාශියක් 1969.10.31 දින පෙ. ව. 9 ට බදුල්ල පොලිස් ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. සියලුම භාණ්ඩ වෙන්දේසියේදී මිලට ගැනීමෙන් පසු වහාම රැගෙන යා යුතුයි.

ඇල්. සී. අබේසේකර,
පොලිස් අධිකාරි, (ඌව)
බදුල්ල.

69.10.1,
බදුල්ල පොලිස් කායභිලයේදීය.

10–55369.1.3 දින අංක 14,834 දරන ගැසට් පත්‍රය

## කොළඹ කච්චේරිය—තුවක්කු වෙන්දේසියේ විකිණීම

රජය සතුව ඇති තුවක්කු සහ රයිපල් තොගයක් 1969 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ. ව. 10 ට කොළඹ කච්චේරියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසියේදී ඉල්ලීමට අවසර ලැබෙන්නේ තුවක්කු මිළදී ගැනීමට බලපත්‍ර ඇති අයවලුන්ට පමණකි.

3. වෙන්දේසිය පිණිස ඇති තුවක්කු සහ රයිපල් 1969 ඔක්තෝබර් මස 29 වැනි දින සවස 2 සිට 4 දක්වා මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැක.

4. වෙන්දේසිය පවත්වන ස්ථානයට ඇතුළුවිය හැක්කේ තුවක්කු ලබා ගැනීමට අවසර පත්‍ර ලබාගෙන ඇති අයවලුන්ට හෝ ඔවුන් විසින් ලිපියකින් බලය පවරන ලද නියෝජිතයින්ට පමණකි.

ඩී. ආර්. උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ඔක්තෝබර් මස 6 වැනිද,
කොළඹ කච්චේරියේ දීය.

10–69269.1.3 දින අංක 14,834 දරන ගැසට් පත්‍රය